# “රාජා භවතු ධම්මිකෝ”

# පෙරවදන

නෙත් FM ගුවන්විදුලි නාළිකාව මඟින් දිනපතා රාත්‍රී 9.00 ට විකාශනය වන ධර්ම දක්ෂිණා වැඩ සටහනේ බදාදා දින ධර්ම දේශනාව සිදු කරනු ලබන කරණ්දෙණිය - උණගස්වෙල සිරිනිවේසාරාමාධිපති ශ්‍රී සද්ධර්මා සුරක්ෂා පදනමේ නිර්මාතෘ ශාස්ත්‍රපති පූජ්‍යපාද පිටිගල ධම්ම විනීත හිමිපාණන් වහන්සේ විසින් දේශිත ධර්ම දේශනා ත්‍රිත්වයක් ඇතුළත් කොට මෙම ධර්ම ග්‍රන්ථය සකස් කරන ලද්දේ

අද අපේ රටට සිදුවී ඇති අති භයානක ව්‍යසනකාරී තත්වය ගැන බිඳක් හෝ මායිම් නොකර

එකිනෙකා පරවා අධික වූ තන්හාවකින් සහ ද්වේෂයකින් යුක්තව මිනිසත්භවේ වටිනාකම තඹදොයිතුවකට මායිම් නොකර සැහැසි වූ ගමනක යෙදී සිටින ඇතැම් වූ

ශ්‍රී ලාංකීය වැසියන්ට මොහොතකට හෝ නැවතී අපි විසින් සිදු කළ යුතු යහපත් දේ පිළිබඳ බිඳක් හෝ සිතා බැලීමට මනස අවධි වේවායි යන යහපත් සිතුවිල්ල පෙරදැරි කරගෙනයි.

බුදු සමිඳුට මගෙ නැමදුම පිදුවා
බුදු සමිඳුගෙ බල වැඩිබව සිතුවා
බුදු සමිඳුට මගෙ ජීවය පිදුවා
බුදු සමිඳුගෙ අවසර මම පැතුවා

ඇසුණු දහම් පද මධුර සුභාෂිත
රැදුණා ඒ පද මාගේ සවනත
කියවීමට අවබෝධෙන් පරිනත
ලියුවෙමි බැතියෙන් මේ වටිනා පොත

ධම්ම විනීත පිටිගල හිමියන්
දෙසනා බුදුබණ මනහර විලසින්
නික්මීමට මේ බියකරු සසරින්
ගනිමු සත්‍ය දේ තම නැණ පමණින්

එෆ්.එම්. අතරෙන් අඹරෙහි දිලෙනා
නෙත් එෆ්.එම්. එක ජනහද බැඳෙනා
ධර්ම දක්ෂිණා සැම සිත් වඩනා
සිහිකරනෙමි නෙත් හදපිරි තුටිනා

වීම නිසා අපි සැවොම අධම්මික
ඇතිවී ඇත මුළු රටේම දැඩි දුක
සැපය ලැබීමට බිඳිමින් මේ දුක
නෙළා ගනිමු ඵල සුතුරේ ධම්මික

# අරමුණ

මෙම ධර්ම ග්‍රන්ථය මේ ආකාරයට මනා ලෙස සකස් කර හෙළිදැක්වීම සඳහා මූල්‍යමය පරිත්‍යාගයන් ලබා දෙමින් මා හට විශාල ශක්තියක් වූ සියලු දෙනා නමින්

පරලෝ සැපත් සියලුම සංසාරගත ඥාතීන්ට පහසුවෙන් හවුන් වඩා නිවන් සුවය ලබා ගැනීමට හැකි වඩා උසස් වූ ආත්ම භාවයන් ලබාගැනීම සඳහා..................

මා ඇතුළු මෙම ධර්ම ග්‍රන්ථය සකස් කරලීමට මූල්‍යමය පරිත්‍යාගයන් සිදුකරලීමෙන් සහ

නන් අයුරින් උදව් උපකාර කළ සියලු දෙනාගේ මේ බියකරු සසර ගමන ඉතා ඉක්මන් වූ භවයකදී නවතාලීම සඳහා ..................

පාරමී ධර්මයක්ම වේවා!

යන කුසල් සිතුවිලි ඇතිකරගෙන පින්වත් ඔබට පිදෙන උතුම් වූ ධර්ම දානයකි.

# පුණ්‍යානුමෝදනාව

මුළු ලෝකෙටම සම්බුදු බණ     දෙසමින්නේ
පිටිගල සමිඳු බුදු සසුනෙහි වැඩ     ඉන්නේ
කුසල් රැසකි ඉන් හිමිහට අත්     වෙන්නේ
එම කුසලයෙන් හිමි මොක්පුරයට     යන්නේ

සතියෙන් සතිය දම් දෙසුමට හිමි     සඳුට
දායකත්වයෙන් පෙරමුණ ගත්     සැමට
ලොකු උපකාරයක් කළ මගෙ     සොයුරියට
පතනෙමි මෙපින් ලැබ යාමට     මොක්පුරට

මේ පොත මේ ලෙසට මාහට     සකසන්න
මුදලින් දායකව දම් මග     සැරිසරන
ඔබ සැමදෙනාගේ බියකරු     හවගමන
නිමකර ලැබේවා සුන්දර     අමනිවන

නෙත් එෆ් එම් එකේ අධිපතිතුමන්     වෙත
ධර්ම දක්ෂිණා මෙහෙවන පිරිස     වෙත
මුද්‍රණාලයේ ගරු නිල මඩුල     වෙත
ගෙන එමි පැතුම් ලැබගැනුමට මොක්     සැපත

පිටකවරය හැඩ කළ පුතු     ධනුෂ්කට
ලොකු මෙහෙයක් සිදු කළ ලක්ෂිත     පුතුට
සිතුවිල්ලකින් වුව දායක වූ     සැමට
පතනෙමි නිවා යාමට සිත     මොක්පුරට

පෙම්බර දෙමව්පියෝ සහ ගුරු     උතුමන්ට
දහමට කැමති පින්වත් පාඨක     සැමට
දෙව්ලොව වෙසෙන පින්වත් සැම     දෙවියන්ට
මෙපිනෙන් ලැබේවා යාමට     මොක්පුරට

# උත්තම පූජාව

මා විසින් ඉතා ශ්‍රද්ධාවෙන් යුක්තව මහත් වූ ප්‍රයාසයක් දරා මනා ලෙස සකස් කර හෙළි දක්වන ලද

මෙම අමිල වූ ධර්ම ග්‍රන්ථය මාගේ අමාමෑණී සම්මා සම්බුදුරජාණන් වහන්සේට උත්තම පූජාවක් ලෙස පූජා කරමි.

පූජා වේවා  පූජා වේවා  පූජාම වේවී

සාදූ !  සාදූ !  සාදූ !

මෙම ධර්ම ග්‍රන්ථයේ ඇතුළත් කර ඇති ධර්ම දේශනාවන් නෙත් ඒ එම් ධර්ම දක්ෂිණාව හරහා දේශිත පූජ්‍යපාද පිටිගල ධම්ම විනීත හිමිපාණන් වහන්සේ ඇතුළු කොටගත් සැරියුත් මුගලන් මහා සංඝ පරම්පරාවෙන් පැවත එන්නා වූ සියලුම සංඝ පීතෘන් වහන්සේලාට

මෙම ධර්ම ග්‍රන්ථය

උත්තම පූජාවක්ම වේවා !

සාදූ !  සාදූ !  සාදූ !

මාව හදාවඩා පෝෂණය කළ මාගේ ආදරණීය දෙමව්පියන්ට, සහෝදරියන්ට

සහ

මාගේ නැණස පාදා දෙමින් මාව නිවැරදි මාවතකට යොමු කළ මාගේ දයාබර ගුරු උතුමන්ට ද

මෙම ධර්ම ග්‍රන්ථය

උත්තම පූජාවක්ම වේවා !

සාදූ !  සාදූ!  සාදූ !

එසේම

මාහට මෙම ධර්ම ග්‍රන්ථය මෙලෙස සැකසීමට මූල්‍යමය දායකත්වය ලබාදුන් සියලු දෙනාම හදාවඩා පෝෂණය කළ ආදරණීය දෙමව්පියන්ට

සහ

ඔවුන්ගේ නැණසස පාදාදෙමින් ඔවුන්ද නිවැරදි මාවතකට යොමු කළ ඔවුන්ගේ දයාබර ගුරු උතුමන්ටද

මෙම ධර්ම ග්‍රන්ථය

උත්තම පූජාවක්ම වේවා !

සාදූ ! සාදූ ! සාදු !

# ධර්ම දේශනා - 1
## (2017.05.31 දින ධර්ම දේශනාව)

සමන්තා චක්ක වාලේසු
අත්‍රාගච්ඡන්තු දේවතා
සද්ධම්මං මුනිරාජස්ස
සුනත්තු සග්ග මොක්ඛදං

ධම්මස් සවන කාලෝ අයං භදන්තා
ධම්මස් සවන කාලෝ අයං භදන්තා
ධම්මස් සවන කාලෝ අයං භදන්තා

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස///

"ගුන්නං වේ තරමානානං ජිම්හං
ගච්ඡති පුංගවෝ,
සබ්බා තා ජිම්හං ගච්ඡන්ති
නෙත්තේ ජිම්හං ගතේ සතිතීති."

ධර්මශ්‍රවණාභිලාෂී සැදැහැති වාසනාවන්ත කාරුණික පින්වත්නි,

මේ වන විට මුළු මහත් ශ්‍රී ලංකාවටම විවිධාකාරයෙන් බලපා ඇති ස්වභාවික ව්‍යසනයකට බොහෝ ජනතාව මුහුණ පාලා සිටින මොහොතක පින්වන්ත ඔබ මේ ධර්මානුශාසනාව අවසානයේ විශේෂ පුණ්‍යානුමෝදනාවකට එකතු වන්නට මුලින්ම සිහිපත් කරමින් අද ධර්ම දක්ෂිණාවේ දායකත්වය ලබාගෙන ධර්ම දානමය ආනිශංස සඳහා හිමිකම් කියන පින්වතුන් පිළිබඳව සිහිපත් කරනවා.

ගලහිටිය - පරකඩුව "නවකලා" නිවසේ පදිංචිව සිටින ලේලිලා, බෑණලා, මුණුබුරු මිණිබිරියන් ඇතුළු සියලු දෙනාම එක් දායකත්වයක් ලබනවා. ඒ වගේම E.M.කමල් පද්මසිරි මහත්මානන් වගේම ශිරානි පීරිස් මැතිනිය නොම්මර 196 D 1 සඳුන්ගම තුඹගොඩ - බලංගොඩ ලිපිනයේ පදිංචිව සිට ඒ වගේම M.B.සුනිල් කාන්තිලාල් මහත්මානන් නොම්මර 80 තුන්වන මාවත හිද්දමුල්ල - පිළියන්දල ලිපිනයේ පදිංචිව සිට ඒ වගේම මහතලා කොළවැව - මැදිරිගිරියේ අංක 165 නිවසේ පදිංචි B.M. මුතුමැණිකේ මෑණියන් ඇතුළු අද දායක පින්වතුන් සිව් පොළක් ධර්ම දානමය ආනිශංස හිමිකර ගන්න වාසනාවන්ත වෙලා තිබෙනවා. එකී දායක පින්වතුන්ගේ අරමුණු සඵල කරවීමටත් ආශිර්වාදයන් ගෙන ඒමටත් ඒ වගේම ගංවතුර නාය යෑම් ආදී කොට ගත්ත සිදු වෙච්ච මහ ව්‍යසනය හේතු කරණ කොටගෙන අභාවයට පත් වෙන්ට යෙදුණ ශ්‍රී ලංකාවාසී සියලුම දෙනාට පුණ්‍යානුමෝදනා කිරීමයි අද විශේෂයෙන්ම ධර්මානුශාසනාව අවසානයේ සිද්ධ කරන්නේ. මතක බණක් වශයෙන් ඒ ව්‍යසනයට පත්ව අභාවයට පත්වෙන්ට යෙදුණ සියලු දෙනා උදෙසා මතක ධර්මානුශාසනාවක් වශයෙන් අද දවස මේ ධර්මානුශාසනාව ශ්‍රවණය කරලා අපි අපේ යුතුකම ඉෂ්ට සිද්ධ කරමු.

සත් පුරුෂ කල්‍යාණ මිත්‍රයෙක් වශයෙන් මා හැමදාම සිහිපත් කරන මතක් කරන ජාතියේ නාළිකාවට අපේ ආශිර්වාදයන් සිද්ධ කරමින් ධර්මානුශාසනාව ආරම්භ කරනවා පින්වතුනේ.

දේවෝ වස්සතු කාලේන
සස්ස සම්පත්ති හෝතුච
පීතෝ භවතු ලෝකෝච
රාජා භවතු ධම්මිකෝ

පින්වන්ත ඔබට බදාදා ධර්ම දක්ෂිණාවට අනුශාසනා කිරීම පිණිස ත්‍රිපිටකය අධ්‍යනය කරන කොට දවසක් දා හැන්දෑවේ තථාගත මගේ බුදුරජාණන් වහන්සේව ධර්මය තුළින් සොයා ගැනීමේ පරමාර්ථයෙන් බණ පොතක් අරගෙන පින්වතුනේ සන්ධ්‍යාවක පෙරළගෙන පෙරළගෙන එනකොට ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ දෙක පොත ඔබට බුදුරජාණන් වහන්සේ පිළිබඳව පැහැදිලි කරලා දෙන්ට භාග්‍යවතුන් වහන්සේව ධර්මය තුළින් පින්වතුන්ට පැහැදිලි කරන්ට තේරුම් කරන්ට පෙන්වලා දෙන්ට හඳුනා ගැනීම සඳහා උදව් කරන්ට සූත්‍ර ධර්ම කියවගෙන කියවගෙන එනකොට පින්වතුනේ මගේ නෙත ගැටුණු විශේෂ සූත්‍රයක් පින්වන්ත ඔබට අද දවසේ පැහැදිලි කරලා දීම සඳහා මම තීරණය කළා. ඒ තමයි අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ අධම්මික සූත්‍රය. මා ඊට පෙරාතුව පින්වතුන්ට දැන් මොහොතකට කලින් කියාපු ගාථාව තේරුම් කරන්ට අවශ්‍යයි.

දේවෝ වස්සතු කාලේන

දේව කියන වචනය යෙදිච්ච එක තැනක් වර්ෂාව කියන අර්ථයෙන්. දේව කියනවා එතන වර්ෂාවට. වර්ෂාව වෙලාවට වහීවා. වර්ෂාව ඕන කරන වේලාවක් තියෙනවා. ආවේලාවේ වර්ෂාව වැස්සහම මුළු අපේ ජන ජීවිතයම අවුල් වෙලා යනවා. අපි හැඩගැහිච්ච ක්‍රමවේද සියල්ලම අවුල් වෙලා යනවා. අපි ගොනු කරගෙන තිබ්ච්ච සමහර විට වගාවන් වර්ෂාව ඉලක්ක කරගෙන වගා කළා නම් හේන් කොටලා කුඹුරු කරලා වපුරලා වෙලාවට වැස්සෙ නැති වුණොත් එහෙම බලාපොරොත්තු වන අස්වැන්න ගන්ට බෑ. එනිසා අතිශය වැදගත් කාරණාව තමයි වෙලාවට වහින එක. අවේලාවේ වහින එකේ අවැඩ බලන්න. සමහර විට ශස්‍ය පැහීගෙන එන වෙලාව. සමහර විට හේනේ එලදාව නෙලන්න ඔන්න මෙන්න තියෙන වෙලාව. අකල් වැස්සක් වැස්ස ගමන් සම්පූර්ණයෙන්ම මොකද වෙන්නේ? අපේ බලාපොරොත්තු සුන් වෙලා යනවා. ඒ නිසා

අවේලාවේ වහින එක වළක්වා ගන්න ඕනෑ. වෙලාවට වැස්ස ගන්ටත් ඕනෑ. ඒ නිසා පිංකමක් කරහම පිංකම අවසානයේ දී පිරිත් කිව්වහම පිරිත අවසානයේ දී ආශිර්වාදයක් කරහම ඒකට එකතු කරලා ඔබ මම ප්‍රකාශ කරන ගාථාව මම දන්නෙ නෑ පින්වතුන් තේරුම් අරගෙනද කියන්නෙ කියලා.

දේවෝ වස්සතු කාලේන

නිසි වෙලාවට හරි වෙලාවට වුවමනා වෙලාවට වර්ෂාව වහීවා. දේව කිව්වේ එතන වර්ෂාව. වෙලාවට වර්ෂාව වැස්සහම

සස්ස සම්පත්ති හෝතුච

ශස්‍යයන්, ගොවිතැන්, පලතුරු, එළවළු ආදී කොට ගත්ත බෝග සම්පත්තිය අඩුවක් නෑ. නිසි විදිහට පැහිලා නිසි විදිහට ගෙට අරගෙන නිසි විදිහට පරිභෝග කරන්න පුළුවන්කම ලැබෙනවා.

පීතෝ භවතු ලෝකෝච

එතකොට පින්වතුනේ ලෝකයාගේ සිත බොහෝම ප්‍රසන්නයි. සතුටුයි. ලෝකයාට එතකොට ප්‍රීතිමත් ජීවිතයක් ගතකරන්න පුළුවන්. සැපසේ වාසය කරන්ට පුළුවන්. එහෙම කරන්ට ලැබේවා ඒ ප්‍රාර්ථනාව තුළ තියෙන්නෙ. හතරවෙනි පදය කියන කාරණාව ඉතාම වැදගත්.

රාජා භවතු ධම්මිකෝ

රජු දැහැමි වේවා. ප්‍රධානියන් දැහැමි වේවා. ලොක්කෝ දැහැමි වේවා. ලොක්කොත් ඉන්න වෙලාව තියෙනවා. ලොක්කියොත් ඉන්න වෙලාවල් තියෙනවා ඔය පුටුවේ. ඒ අය දැහැමි වේවා. ඇයි අප විසින් එසේ ප්‍රාර්ථනා කළ යුත්තේ? ලොක්කන්ගේ හෝ ලොක්කියන්ගේ ක්‍රියාකලාපය සමස්ත රටවැසියාටම බලපානවා. රටවැසියා කිව්වහම පින්වතුනේ බණට අනුව ඔබ හිතන්ට ඕනෑ මිනිස්සු විතරක් නම් නෙවෙයි. රටවැසියා කියලා කිව්හම ඒ රටේ වාසය කරන සතා සිවුපාවා ගහ කොළ ඇල දොළ ගංගා මේ සියල්ලම අයිති පින්වතුනේ රජ්ජුරුවන්ට. රජ්ජුරුවෝ එහි පාලකයා.

රජ්ජුරුවෝ එහි අයිතිකාරයා හැබැයි පෞද්ගලිකව නෙවෙයි. මම මීට පෙරාතුව ධර්මානුශාසනාවකදී රජු කියන වචනය අර්ථකථනය කළා. රජු කියන වචනයට විශේෂයෙන් පින්වතුනේ මේ දහමේ පාලි භාෂාවේ විස්තර කරන්නේ රජු කියලා කියන්නේ භූපති භූපාල කියන වචන තමයි තියෙන්නේ. බලන්න එහි අර්ථය. භූපති භූමියට අධිපති භූමියෙ ලොක්කා. භූපාල - පොළොව පාලනය කරන එක්කෙනා. පොළොව පාලනය කරන කෙනාට ගහකොළ සතා සිවුපාවා ඇල දොළ ගංගා සියල්ල අයිතියි. ඔහු ඒ සියල්ලේම ආරක්ෂකයාමයි. ජනපති කිව්වහම වත්මන් ලෝකය තුළ ව්‍යවහාර කරන වචනය. මේ කියන සැබෑ අර්ථය කියවෙන්නේ නෑ. ලෝකයේ ඔය තනතුරට දැන් ව්‍යවහාර කරන්නෙ ජනපති කියලා. එතකොට ජනපති ජනතාවගේ අධිපති. වචනාර්ථය සැලකුවහම ඔහු වගකිව යුත්තේ ජනතාවට පමණයි. හැබැයි ලෝකයේ වත්මන් ජනපතිවරු දෙස බැලුවහම ඒක එහෙම තමයි කියලා නම් පෙනෙන්න තියෙනවා. බොහෝ ජනපතිවරුන්ට වැඩක් නැහැනෙ. ගස් කොළන් කපලා දැම්මට වනන්තර කපලා දැම්මට ප්‍රශ්නයක් නැහැනෙ. කඳු පාත් කළාට ප්‍රශ්නයක් නැහැනෙ. ගංගා ඇල දොළ හරස් කරලා ඒවා විනාශ කළාට ඒ අයට ප්‍රශ්නයක් නැහැනෙ. ඒ වගේම සතුන් ඝාතනය කරලා සතුන් මරලා සතුන් මරණ ක්‍රම වේදයන් කොච්චර වර්ධනය වුණත් මේ වචනයෙන් කියවෙන අර්ථය පිළිඅරන් තියෙන අයට ප්‍රශ්නයක් නැහැ. හැබැයි නමේ නෙවෙයි ගැටලුව තියෙන්නෙ. නමේ නෙවෙයි ප්‍රශ්නය තියෙන්නෙ තනතුරේ. ඒ නිසා රජු දැහැමි වේවා. රජු ධාර්මික වෙන්ට අවශ්‍යයි. බලන්න පින්වතුනේ විග්‍රහ කරන අධම්මික සූත්‍රය සංයුක්ත නිකායේ තියෙන්නෙ.එතකොට මේ සේරම ටික සාවත්ථි නිධාන විදිහට දක්වලා තියෙන්නෙ සූත්‍ර දහයක් එක තැනට. එහෙනම් සැවැත් නුවර දී තථාගත මගේ බුදු රජාණන් වහන්සේ දේශනා කරපු දේශනාව.

පින්වතුනේ,

“ගුන්නං වේ තරමානානං ජිම්හං
ගච්ඡති පුංගවෝ.”

තරණය කරන ගොනුන් අතරෙන් මුලට යන ප්‍රධාන ගොනා කම්මැලියෙක් නම් කම්මැලියෙක් නම් ගොන් අලියෙක් නම් ඒ නායක ගවයා කම්මැලි නිසා කුටිලව යනවා කියන්නෙ වැරදි පාරේ යන්නෙ. වැරදි පාරෙ යනකොට

“සබ්බා තා ජිම්හං ගච්ඡන්ති”

පස්සෙන් එන ඔක්කෝම හරක් රැළ යන්නෙත් නායක ගවයා යන විදිහට.

“නෙත්තේ ජිම්හං ගතේ සතී.”

අනිකුත් සේරම ගවයෝ යන්නේ කුටිල විදිහට. ඒ කියන්නෙ නායක ගවයා යන විදිහට. වැඩේ තියෙන්නෙ පින්වතුනේ මේ ගාථාව ඔය විදිහට පැහැදිලි කරලා ඊළඟට කියන කාරණාවයි වැදගත් වෙන්නෙ. මේකෙ තියෙන්නේ උපමාවක්නෙ.

“ගුන්නං වේ තරමානානං ජිම්හං
ගච්ඡති පුංගවෝ......”

පුංගව කියලා කියන්නෙ ප්‍රධාන ගවයා. නායක ගවයා වැරදියට යනකොට ගව රැළක බලන්න පින්වතුනේ ප්‍රධාන ගවයෙක් මුලට ඉස්සර වෙලා යනකොට ඒ ඔහු අනුකරණය කරමින්නෙ අනික් සේරම ගවයෝ ටික යන්නෙ. ගඟකින් එතෙර වෙන්න තියෙනවා නම් ඒ ගොල්ලන්ට පීනන්න පුළුවන්. ඒ අය ගඟට බැස්සුවහම එගොඩ වෙනවා. හැබැයි ගඟේ එගොඩ වෙන්නෙ ඉස්සර වෙලා යන නායක ගවයා අනුකරණය කරමින් ඔහු යන පැත්තට. එයා යන්නෙ හරහට නම් වැරදියට නම් ගැඹුරු පැත්තට පිහිනා ගෙන නම් සියලුම ගවයො ටික යන්නෙ ඒ විදිහට තමයි.

‘‘සබ්බා තා ජිම්හං ගච්ඡන්ති” කිව්වේ ඒකයි. මේ උපමාවෙන් තථාගත මගේ බුදුරජාණන් වහන්සේ ඊළඟට කියන කාරණාව

වැදගත්. "ඒව මේව මනුස්සේසු". අන්න වැදගත්.මේ උපමාව පරිදි ඔය පරිද්දෙන්ම මිනිසුන් අතරෙන්

"යෝ හෝති සෙට්ඨසම්මතෝ."

මේ උපමාව අනුව මිනිස්සු අතරේ යම්කිසි ශ්‍රේෂ්ඨ සම්මත කෙනෙක් ඉන්නවාද ශ්‍රේෂ්ඨ සම්මත කියලා කියන්නෙ ලොක්කා, නායකයා. නායකයෙක් ඉන්නවාද "සො වේ අධම්මං චරති පගේව ඉතරා පජා" ඔහු අධම කෙනෙක් නම් අධාර්මික කෙනෙක් නම් අධර්මයෙන් කටයුතු කරන කෙනෙක් නම් ඉතිරි ප්‍රජාව ගැනම කථා කරන්න තියෙන්නෙ මොකක්ද?

"ඉතරා පජා" - ඉතුරු ප්‍රජාව ගැන මොකක්ද කතාකරන්න තියෙන්නෙ ලොක්කා අධාර්මික නම් ප්‍රධානියා අධාර්මික නම් මොකක්ද වෙන්නෙ?

"සබ්බං රට්ඨං දුක්ඛං සේති
රාජාවේ හෝතධම්මිකෝ."

මුළු රටම දුක්ඛිත වෙනවා.

"සබ්බං රට්ඨං දුක්ඛං සේති."

සමස්ත රටම දුකට පත්වෙනවා. ඒ නිසාවෙන්ම මෙහි සඳහන් කරනවා

"රාජා වේ හෝතධම්මිකෝ."

ඒකාන්තයෙන් රජු දැහැමි වෙන්ට ඕනෑ. රජු දැහැමි වෙන්ට ඕනෑ. රජු දැහැමි නොවුණහම ඔන්න සිද්ධ වෙන වැඩේ. දක්වලා තියෙනවා මෙතන. එතකොට ඊළඟ ගාථාවෙන් පැහැදිලි කරලා දෙනවා පින්වතුනේ.

"ගුන්නං වේ තරමානානං උජුං ගච්ඡති පුංගවෝ,
සබ්බා තා උජු ගච්ඡන්ති නෙත්තේ උජුගතේ සති."

තරණය කරන එතෙර වන ගොනුන් අතරෙන් පුංගවයා මුල් ගවයා ප්‍රධාන ගවයා නායක ගවයා කුටිල නෑ අකුටලීව යන්නෙ. කම්මැලි නෑ කෙළින් යන්නෙ. ඍජුව ගමන් කරන්නෙ. අන්න එහෙම ගමන් කරනවා නම් "උජුං ගච්ඡති".. ඍජුව ගමන් කරනවා නම් ප්‍රධාන

ගවයා "සබ්බා තා උජු ගච්ඡන්ති". අනිකුත් සේරම ගවයෝ නායක ගවයා අනුව තමයි යන්නෙ. නායක ගවයා අනුකරණය කරගෙන තමයි යන්නෙ. ඒ ගොල්ලොත් කෙළින් යනවා.

"සබ්බාතා උජු ගච්ඡන්ති." ඒ සියලුම ගවයන් ඍජුව යනවා. ඒ හැම ගවයෙක්ම ඍජුව යන්නේ නායකයා අනුකරණය කරමින්. එතනත් උපමාව. උපමාවෙන් කියන්නේ මේක. "ඒව මේව මනුස්සේසු." ඔය පරිද්දෙන්ම මිනිස්සු අතරේ "යෝ හෝති සෙට්ඨසම්මතෝ." - යම්කිසි ශ්‍රේෂ්ඨ සම්මත පුද්ගලයෙක් ඉන්නවා නම් මිනිසුන් විසින් සම්මත කරලා අපේ ශ්‍රේෂ්ඨයා අපේ නායකයා අපේ ලොක්කා අපේ රජු කියලා කවුරු හරිව සම්මත කරගෙන තියෙනව නම්

" සෝ චේව ධම්මං චරති පගේව ඉතරා පජා" ඔහුත් දහම් පුරන්නට ඕනෑ. ඔහු ධර්ම මාර්ගයේ යන්ට ඕනෑ. ඔහු සාධාරණ වෙන්ට ඕනෑ. ඔහු ඍජු වෙන්ට ඕනෑ. අන්න එතකොට " පගේව ඉතරා පජා " ප්‍රජාව ගැන මොනවාද කතා කරන්න තියෙන්නෙ. ඉතාමත් හොඳයි. ඇයි " සබ්බං රට්ඨං සුඛං සේති "

මුළු රටම සැපසේ ඉන්නෙ. ඇයි මුළු රටම සැපසේ ඉන්න හේතුව?

" රාජා චේ හෝති ධම්මිකෝති "

රජු ධාර්මිකයි. රජු ධාර්මික නම් මුළු රටම සුඛිත වෙනවා කියන එකයි මේ ගාථාවේ පැහැදිලි කරලා තියෙන්නෙ. පින්වතුනේ,

මේ උපමා අනුසාරයෙන් එදා තථාගත මගේ බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරන්ට යෙදිච්ච කාරණාව පින්වතුන්ට සිහිපත් කරලා දෙන්න උත්සාහවත් වෙනවා අද ධර්මානුශාසනාවේදී. අපි පින්වතුනේ තාක්ෂණය ගෙට ගත්ත මිනිස්සු දැන් මේ වෙනකොට. නවීන තාක්ෂණය ගෙට අරගෙන තියෙන්නෙ. ඒ නිසා බොහොමයක් වැඩ අපේ පහසු වුණා කියලා තමයි කතාවට නම් කියන්නෙ. මම දන්නෙ නෑ ක්‍රියාවෙන් ඒක ඇත්තද කියලා පින්වත් ඔබ තමයි දන්නෙ. මේ තාක්ෂණය එන්නට මත්තෙන් අපි කල්පනා කරමු අපේ අම්මා කෙනෙක්ට පැවරිලා තිබිච්ච වැඩ කන්දරාව.

අම්මා කෙනෙක් විසින් සිදු කරන ලද වැඩ කන්දරාව කොයි තරම්ද කියලා. වත්තේ ඇවිදලා දරටික පොල් කොළ ටික සොයා ගන්ට ඕනෑ. දර පලන්ට ඕනෑ. හැම ගෙදරකම ඒක නිසා පොරොවක් තිබුණා. දරටික පලලා දුමේ අඩුක් කරලා තියා ගන්ට ඕනෑ. අඩුවෙන්න අඩුවෙන්න අඩුක් කරගන්න ඕනෑ. එතකොට දැන් වගේ කුස්සියට ගිහිල්ලා කරාමය කැරකෙව්වහම වතුර නෑ. ළිඳ ළඟට ගිහිල්ලා කළගෙඩියට වතුර පුරවලා ඉණට තියලා අරගෙන එන්න ඕනෑ ගෙදර. ඒ වතුර කළගෙඩියෙන් තමයි වළං ටික සේදුවෙ. පිඟන් ටික සේදුවෙ.හාල් සේදුවෙ. එළවළු ටික සෝදා ගත්තෙ. අතපය සෝදා ගත්තෙ. පුංචි දරුවන් වැසිකිළි කැසිකිළි කරහම පස්ස පැත්ත සේදුවෙ. ඔය සේරම කළේ උකුල තියලා ඉණේ තියලා අරගෙන ආපු කළගෙඩියේ වතුර වලින්. දැන් වගේ නෙවෙයි තාක්ෂණය තිබුණෙ නෑ මේ කියන තරම් පහසුවට. ඔය සේරමත් කරන ගමන් ලිපට පිඹින්න ඕන. හාල් සෝදලා හදලා ලිපේ තියලා කී සැරයක් ලිපට පිඹින්න ඕනද. බඩේ තියෙන හුළං ටික ඉවරයි ලිපට පිඹලා බත පැහෙන කොට. ලිපට පිඹලා අළු නාගෙන දැලි ගාගෙන ගිනි කාගෙන බතක් හරි කර ගන්ට කොච්චර දුක් විඳිනවාද. වත්තෙ ඇවිදලා පලා ටිකක් කඩාගෙන කොළ ටිකක් කඩාගෙන ඒක ගෙනත්ලා හදලා දැන් වගේ එළවළු නෑ ගොඩ ගහගෙන ගේ ඇතුළෙ. එවලෙට එවලෙට තමයි වත්තෙන් හොයා ගන්නෙ සමහර වෙලාවට බොහෝ පලා ටිකක් කොළ ටිකක් මැල්ලුමක් හදාගන්ට ඕන නිසා. වෙලා තිබුණා ඇවිදලා ඒවත් හොයා ගත්තා. ගොටු කොළ ටික නෙලා ගත්තා. ගෙනාවා සුද්ද කළා. උදේට කාලා විනාඩියක් ඉන්න බෑ අම්මාට. උදේට කාලා කුස්සිය අස්පස් කරලා ඉවර වෙනකොට දවල්ට උයන්න ඕන වෙලාව ඇවිල්ලා. දර පොල් කොළ ටික හොයාගෙන දැන් දවල්ට උයන්න ලෑස්ති වෙන්න ඕනෑ වළං පිඟන් ටික ආයිමත් හෝදලා. අම්මලා නාකි වුණේම කුස්සියට. නාකි වුණේම කුස්සියට.හැබැයි පුදුම දේ කියලා කියන්නෙ කාලයත් තිබුණා.

වැඩ කරන්නත් පුළුවන්කම තිබුණා. වංගෙඩියේ කොටාගෙන මිරිස් ගලේ අඹරාගෙන ඔය සේරම කටයුතු ටික කළානේද පින්වතුනේ. ඔය තුන් වේල කාලා ඉවර වෙන කොට හැලප කන්න ඕනෙයි කිව්වොත් අම්මා හාල් පෙගෙන්න දාලා සවස දෙකට විතර ඒක ආයෙමත් බට ගොට්ටට දාලා දිය ටික පෙරෙනකම් තියලා වංගෙඩියේ දාලා අම්මයි ලොකු අම්මයි දෙන්නත් එක්ක දෙමෝලෙන් කොට කොටා හල හලා පිටි අනලා අත් ගහලා හැලපත් හදලා දෙනවා කන්න. ආප්ප කන්න ඕනෑය කියලා කිව්වොත් ඉතින් දුක් විඳලා දහදුක් විඳලා දර පොල් කොළ හොයාගෙන උඩිනුත් ගින්දර දාගෙන යටිනුත් ගින්දර දාගෙන ආප්ප හදලා දෙනවා. එකෙන් එක එකෙන් එක තමයි ඉතින් හදන්නෙ. තාක්ෂණය නෑනෙ දැන් වාගේ. දැන් තියෙනවා එක පාරට ආප්ප දහයක් විස්සක් දාන්න පුළුවන් මැෂින් හදලා තියෙන්නෙ.විනාඩි තුනක් ඇතුළත ආප්ප විස්සක් එක පාරම එළියට එනවා. අපි ඒක පස්සෙ කතා කරමු.

ඔය සේරමත් කරලා ඉවරවෙලා ගෙදර ඉන්න හත් අට දෙනෙකුගෙ රෙදි ලොට් එකක් අරගෙන ගිහිල්ලා ළිඳ ළඟට ගලේ ගගහා අපුල්ල අපුල්ල සමහර විට දොළ පාර ළඟට අරගෙන ගිහිල්ලා ඔබ ඔබා ගලේ ගගහා සබන් ගගා මිරික මිරික උඩ පැන පැන උඩ පැන පැන අපුල්ලලා සෝදලා වේළලා පොල් කටු දාන ඉස්ත්‍රික්කයෙන් මැදලා හදලාත් දෙනවා ඉතින් අවශ්‍ය නම්. දැන් බලන්න කල්පනා කරලා කොටන ඒවා අඹරන ඒවා ඔක්කෝම ඉතාමත්ම ලේසියිනෙ දැන් ග්‍රයින්ඩර්, බ්ලෙන්ඩර් කුස්සියට ගත් නිසා. වොෂින් මැෂින් එක ආවා. රෙදි ටික දැම්මා ස්විච් එක එබුවා අවශ්‍ය ගාණට වතුර ආවහම වැහුවා. ගහල තියල යන කොට රෙදි කැලිම ඇඹරිලා මිරිකිලා උඩ පැනලා ඇපිල්ලිලා ඒ ගොල්ලොම සේදිලා වේළිලා එළියටත් එනවා විනාඩි කිහිපයක් ඇතුළේ. දැන් ඉතින් තාක්‍ෂණය එච්චර දියුණු වෙච්ච නිසා හිතන්න දැන් කොච්චරනම් කාන්තාවකට කාලය ඉතුරු වුණාද රෙදි සෝදන

එකෙන්. දර ඕනෙ නෑ. පොල් කොළ ඕනෙ නෑ. ගිනි කන්න ඕනෙ නෑ. දැලි ගාගන්න ඕනෙ නෑ අළු ගාගන්න ඕනෙ නෑ. මොකවත් නෑ. දැන් කරන්ට් එකට ගැහුවා ලිපේ තිබ්බා හාල් ටික හෝදලා හදලා. ඕන තුත්තු කුඩුවක ගිහිල්ලා එන්න පුළුවන් බත ඇට්ට කුණා වෙලා නෑ. කිසිම ගැටළුක් නෑ. බත මනාව පැහිලා ඉදිලා සියල්ලම සිදු වෙලා අවසානයි. ඒ ගැන බලන්න දෙයක් නෑ. පාරෙන් පාර පියන ඇරලා බලන්නවත් හැඳි කූර ඇනලා බලන්නවත් ඒ මුකුත් බලන්න දෙයක් නෑ. වතුර ටික හිඳිලා යනකොට බත පැහිලා සියල්ලම අවසාන වෙලා. ඒ ගැන බලන්න දෙයක් නෑ. ඉතින් ඔය අතරෙ ශීතකරණයක් තියෙන නිසා ඉස්සර වගේ නෙවෙයි ඉතින් තුන් වේලක් උයන්න ඕනෙ නෑ. එක වේලක් උයල හදලා ඉවරවෙලා ඉතුරු ටික ප්‍රිජ් එකේ දාලා තිබ්බහම ආයෙ කන වෙලාවට එළියට අරන් රත් කරලා ආයෙ කන්ට පුළුවන්. එහෙමත් කරනවාය කියනවනෙ දැන්.

ඉතින් මට තියෙන ප්‍රශ්නෙ තමයි දැන් අර හැම දේකින්ම කාලය ඉතුරු වුණාට පස්සේ මොකටද ශීත කරලා ආයේ  රත් කර කර කන්නේ. කාලය තියෙනවානේ උයා ගන්න. ගලේ දාලා අඹරපුවා වනේ දාලා කොටපුවා බ්ලෙන්ඩර් එකෙන් කරන කොට ළිඳ ළඟට  ගිහින් දොළ ගාවට ගිහින් උඩ පැන පැන අපුල්ල අපුල්ල මිරික මිරික හෝදපුවා ඔක්කොම වොෂින් මැෂින් එකෙන් කරන කොට කාලය මොන තරම් නම් ඉතිරි වුණාද තාක්ෂණය නිසා. දැන් පින්වතුනේ ඒ ඉතුරු වෙච්ච කාලය පාවිච්චි කරන්න එපායැ දැන් ඉතින් තුන් වේලට පස් වේලක් උයාගෙන කන්න වෙලාව තියෙනවනේ. අනිත් එක අර සේරම වැඩ ටික කළේ එදා අම්මා කෙනෙක් දරුවෝ හතක් අටක් දහයක් දොළහක් සමහර අම්මලා හදන ගමන්. වැස්සිට තණ කොළත් කපනවා ඒ අතරේ. මොකද ගෙදර සියලුම දේවල් ආර්ථිකයේ ප්‍රධානම අතිරේක ආර්ථික මාර්ගය තමයි ගව පාලනය. හැම ගෙදරකම ඒක නිසා කිරි ගවයෙක් හිටියා. වැස්සිට තණකොළ ටිකත් කපනවා ඔය අතරේ.

දරුවෝ පුංචිම දරුවෝ තුන් හතර දෙනා මනාව බලා ගන්නවා හීරීම් තුවාලයක්වත් ඇත්තේ නෑ. මේ සේරම වැඩ කරන ගමන් හතර පෝයට සිල් ගන්නත් අමතක කළෙත් නෑ. ඒ පැත්තත් කළා. මේ සියල්ලම මැෂින්වලට බාරදීලා යන්තරවලට බාරදීලා යන්තරවලින් කරද්දී ළමයෙක් හෝ දෙන්නෙක් විතරක් හදා ගත්ත වර්තමානයේ අම්මලාට තාත්තලාට මොකක්ද මේ වෙලා තියෙන්නේ? ඇහුවොත් කියන්නෙ කාලය නෑ කාලය නෑ කියලා. ඉස්සර කාලේ සර්පයෙක් දෂ්ඨ කරහම ගමේ වෙදෙක් ළඟට ගිහිල්ලා ඒ වෙදකම් ටික වෙලාවට හරියට කර ගන්න බැරි වුණොත් එහෙම මැරිලා යනවා. හාට් ඇටෑක් ආවහම ඒ කාලේ කිව්වේ යකා ගැහුවා කියලා. දන්නෙ නැති නිසා. ඉතින් තොයිලයක් අරකක් මේකක් කර කර ඉන්නවා. අන්තිමට මැරිලා යනවා. දැන් එහෙම නෙවෙයි. ඒ තරමට වෛද්‍ය විද්‍යාව දියුණුයිලු. ඒ නිසා හාට් ඇටෑක් එනවත් එක්කම හඳුනා ගත්තොත් ගියා පපුව මාරු කළා. අලුතෙන් පපුවක් දැම්මා. පපුව මාරු කළා අලුතෙන් දැම්මා පපුව. දැන් වෛද්‍යවරයා ළඟට අරගෙන ගිය ගමන්ම එහෙන් මෙහෙන් බට ගැහුවා, වයර් ගැහුවා, ඇමුණුවා, ගත්තා සේරම ටික T.V. එකට. ඒක දිහා බලාගෙන ලෙඩේ හඳුනා ගත්තා. ප්‍රතිකාර කළා. ඉස්සරට වඩා වෛද්‍යවරු වැඩියි. රෝහල් වැඩියි. ප්‍රතිකාර වැඩියි. ඖෂධ වැඩියි. පින්වන්ත ඔබ මට උත්තරයක් දෙන්න එහෙනම් ඉස්සරට වඩා ලෙඩ වැඩිවෙන්ට ඕනැද? අඩු වෙන්ට ඕනැද? රෝහල් වැඩි වෙනකොට ප්‍රතිකාර වැඩිවෙන කොට වෛද්‍යවරු වැඩි වෙනකොට නව සොයා ගැනීම් හරහා ඕනෑම රෝගයකට ප්‍රතිකර්ම තියෙනවා නම් ලෝකයේ එන්න එන්නම ලෙඩ අඩු වෙන්ට ඕනැද ? වැඩිවෙන්න ඕනැද? ඔබම කල්පනා කරලා බලන්න මට නම් හිතෙන්නෙ ලෙඩ අඩුවෙන්න ඕනෑ කියලා. ඒ වුණාට එහෙම එකක් වෙලා තියෙනවද? මට හිතෙන්නෙ නම් වෙලා නෑ කියලා. එහෙනම් මේ කියන තාක්ෂණය වෛද්‍ය විද්‍යාවේ දියුණුව බිංදුවක්වත් වැදගත් වෙලා තියෙනවද

වැඩක් වෙලා තියෙනවද මිනිස්සුන්ට. බ්ලෙන්ඩර් එකෙන් වැඩක් වෙලා නෑ. වොෂින් මැෂින් එකෙන් වැඩක් වෙලා නෑ. රයිස් කුකර් එකෙන් වැඩක් වෙලා නෑ.නවීන වෛද්‍ය විද්‍යාවෙන් ප්‍රයෝජනයක් වෙලා නෑ. ප්‍රයෝජනයක් මේ සියලු දේවලින්ම වුණා නම් එන්න එන්නම මිනිසුන්ගේ ආයුෂ අඩුවෙන්න බෑ. වැඩි වෙන්න ඕනෑ. මෙතරම් ආහාර පාන ගන්න හැටියට මේ තියෙන තරම් සනීපාරක්ෂක ක්‍රමවේද පාවිච්චි කරන හැටියට පුංචි අසනීපයටත් ක්ෂණික ප්‍රතිකර්ම තියෙන හැටියට මිනිස්සු නීරෝගී වෙන්න ඕනෙ. ඒ නිසා ආයුෂ වැඩි වෙන්ට ඕන හැමදේම කරන්නෙ යන්ත්‍ර සූත්‍ර වලින් නිසා මිනිසා මිනිසාට විවේකය එන්න ඕන. විවේකය එන විට මනස හොඳයි සතුටුයි. සතුටු සිත් ඇති කොට ලේ ධාතුව පිරිසිදුයි. ලේ ධාතුව පිරිසිදු වෙනකොට නීරෝගියි. නීරෝගී නම් ආයුෂ වැඩියි. එහෙම වෙන්ට ඕන. ඒ වගේම ඔය විවේකය නිසා චිත්ත ප්‍රසාදය ඇති වෙච්ච නිසා ඇති වෙන්ට ඕනෑනෙ. ඒ හරහා පුද්ගලයන්ගේ ලේ ධාතුව පිරිසිදුයි. එහෙනම් ශරීර වර්ණයත් එන්න එන්නම පැහැපත් වෙන්ට ඕනෙ. හැබැයි ඔයදෙකම වෙලා නෑ. මේ සියළුම දේවල් ගෙට අරන් තියෙනවා.ළං කර ගෙන තියෙනවා පාවිච්චි කරනවා ඒ තුළ ජීවත්වෙනවා. එන්න එන්නම ලෝකයාගේ ආයුෂ අඩු වෙලා තියෙනවා. එන්න එන්නම ලෝකයාගේ ලස්සන දුර්වල වෙලා තියෙනවා. දුර්වර්ණ වෙලා තියෙනවා. ලස්සන අඩු වෙච්ච නිසා තමයි අපට මීටර් සීයෙන් සීයට බියුටි සැලුන් දාන්න වෙලා තියෙන්නෙ. සමහර අයගේ මල්ල පරීක්ෂා කළොත් ඒක ජංගම බියුටි සැලුන් එකක් එහෙම පිටින්ම. ඇයි එහෙම වුණේ? ඒ අපි දුර්වර්ණ වෙච්ච නිසා. දුර්වර්ණ වුණේ ඇයි කියලා හොයාගෙන යන කොට මම මේ තවමත් එන්නේ අධම්මික සූත්‍රයට ප්‍රවිෂ්ට වෙන්න දෙයක් හදා ගන්න. ඊළඟ එක තමයි තාක්ෂණය, විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, මේ සියලු දේවල් දියුණු නම් මිනිසුන්ගේ ජීවිතයට යහපතක් සිද්ධ වුණා නම් පින්වතුනේ මිනිසුන්ගේ ශරීර ශක්තිය එන්න එන්න වැඩිවෙන්න ඕන. එන්න එන්නම වැඩි වෙන්ට ඕන.

නමුත් බලන්න පින්වතුනේ එන්න එන්නම මිනිසුන්ගේ ශරීර ශක්තිය දුර්වල වෙච්ච එක නේද වෙලා තියෙන්නෙ කියලා.

මේ ලංකා ඉතිහාසයේ අනුරාධපුර යුගයට යන කොට දස මහ යෝධයෝ විසිමහ යෝධයෝ ගැන අපි කතා කරන්නේ පෙනෙනවද කෙළින් කරපු ගල් කණුවල හැටි. කරපු වැඩ රාජකාරි වල හැටි. කොස්, දෙල්, කොළ, අල, බතල, කිරි පැණි මේවා වෙන්න ඇති ඒ දවස්වල කෑවේ. අද ආහාර මෙනු එක කියවා ගන්නත් අවම වශයෙන් විනාඩි විස්සක් තිහක් ඕනෑ. ඒ තරම් කෑම ජාති තියෙනවා. මේ කන කෑමෙ හැටියට එකසිය පනස් මහා යෝධයෝවත් බිහි වෙන්ට ඕනෑ නේද? හැබැයි හොඳටම දුර්වල මිනිස්සු නේද හැදිලා තියෙන්නෙ. කායික වශයෙන් සෑහෙන්න දුර්වල මට්ටමක නේද බහුතරයක් වැඩිමනක් අය ඉන්නේ. කෝ තාක්ෂණය? කෝ නවීන ආහාර පාන ආදිය ප්‍රයෝජනයක් වෙලා තියෙනවද? දැන් ලෝකයේ බලන්න පින්වතුනේ එන්න එන්නම අඩු වෙච්චි ඒවා තුනක් මම කීවේ. ආයුෂ අඩුවෙලා. ඒ වගේම ලෝකයාගේ ශරීර වර්ණය අඩුවෙලා. දුර්වර්ණ වෙලා. ඒවගේම ලෝකයාගේ ශරීර ශක්තිය දුර්වල වෙලා. හැබැයි මේ හරහා මේ නවීන තාක්ෂණය දියුණුයි කියලා අපි කතා කරන දේ හරහා එක දෙයක් වැඩිවෙලා තියෙනවා. ” බහු ආබාධා හොන්ති ” ආබාධ වැඩි වෙලා තියෙනවා. ලෙඩ වැඩිවෙලා. ” අප්පායුකා ” ආයුෂ අඩුවෙලා තියෙනවා. ” දුබ්බලා” බලය දුර්වල වෙලා. ” දුබ්බණ්ණා ” වර්ණය දුර්වල වෙලා ” බහු ආබාධා ” ආබාධ නම් වැඩි වෙලා තියෙනවා. දැන් මෙන්න ලෝකයේ එන්න එන්නම සිදු වෙච්ච දේ. දියුණුයි කියලා කතා කරන ලෝකයාට සිදු වෙච්ච දේ. එතකොට මේ සමස්ත ලෝකයේම මිනිස්සුන්ට බලපාපු කාරණාවල්. ඒ නිසා රටින් රටට පොඩි පොඩි වෙනස්කම් තියෙනවා ජීවත්වන මිනිස්සුන්ගේ අපේක්ෂිත ආයු ප්‍රමාණය. අපේක්ෂිත ආයු ප්‍රමාණය මෙච්චරයි කියලා දක්වලා තියෙනවා රට රටවලින්. ඒවා එකින් එකට පොඩි පොඩි වෙනස්කම්

තියෙනවා. සමස්තය සලකලා බලනකොට මුළු ලෝකයේම මිනිසුන්ගේ ශරීර ශක්තිය දුර්වල මට්ටමක තියෙන්නේ. සමස්තය සලකන කොට මුළු ලෝකයේම මිනිසුන්ගේ මීට ඉතිහාසයේ කලින් තිබ්බ්ච විශේෂයෙන් දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ විසි දෙවන සූත්‍රයේ දක්වලා තියෙන විදිහට මේ වත්මන් පෘථිවියේ ආරම්භය සිදු වෙච්ච මුල් කාල වකවානුව ගැන කල්පනා කරන කොට එවකට මිනිස්සුන්ගේ තිබ්බ්ච ශරීර වර්ණය මොන තරම් දුර්වල වෙලාද දුර්වර්ණ වෙලාද කියලා පැහැදිලිව පෙනෙනවා. එන්න එන්නම දුර්වර්ණ වෙලා. ඒ වගේම කවදාවත් නාහපු විදිහට ලෙඩ රෝග. ලෙඩ තියෙනවා. අලුත් ලෙඩ තියෙනවා. නම් නැති ලෙඩ තියෙනවා. ලේසිම ලෙඩේ තමයි විෂබීජයක් ගියා. ඒක තමයි නමක් නැති ඕනෑම එකකට දාන්න පුළුවන් හොඳම ලෙඩේ. සොයාගන්න විදිහක් නැහැ ශරීරගත වුණා. ආසාදනය වුණා. මරණයට පත් වුණා. එතකොට මිනිය කැපුවහම අවසාන පරීක්ෂණයේ මොකක්ද කියන්නේ? විෂබීජයක් ශරීරගත වුණා මැරුණා. දැන් බලන්න එන්න එන්නම ලෝකයේ මොනවද වැඩිවෙලා තියෙන්නෙ ලෙඩ රෝග. මීට හේතුව දක්වන අධම්මික සූත්‍රයට ඔන්න දැන් අපි ප්‍රවිෂ්ටයක් හදාගෙන තියෙනවා. දැන් මේ ප්‍රධාන ප්‍රශ්න හතර හිතේ තියාගෙන ඕනෑ අධම්මික සූත්‍රය විග්‍රහ කරගන්න. මොනවද ප්‍රශ්න හතර?

ලෝකයේ එන්න එන්නම මිනිස්සුන්ගේ ආයුෂ අඩු වෙච්ච එකට හේතුව. ඒ වගේම වර්ණය දුර්වල වෙච්ච එකට හේතුව. ඒ වගේම බලය අඩුවෙච්ච එකට, ශරීර ශක්තිය අඩු වෙච්ච එකට හේතුව. ඒ වගේම ආබාධ වැඩි වෙච්ච එකට හේතුව "අප්පා යුකා දුබ්බණ්ණා, දුබ්බලා , බහු ආබාධා." මේ ප්‍රධාන ප්‍රශ්න හතරට මිනිස්සුන්ට මුහුණ දෙන්න සිද්ධ වුණේ කාගේ වරදින්ද කියන බව මොකක් නිසාද කියන බව කාගේ ක්‍රියාකලාපය තුළ තියෙන දුර්වලතාවයක් පදනම් කරගෙනද කියන බවට හේතුවක් සාධකයක් නිමිත්තක් දක්වන අධම්මික සූත්‍රය

විග්‍රහ කර ගත්තහම තව දුරටත් තථාගත බුදු රජාණන් වහන්සේ පිළිබඳව හඳුනා ගන්නත් පුළුවන්කම තියෙනවා. මොනතරම් නම් තුන්කල් දක්නා නුවණක් තථාගත මගේ බුදුරජාණන් වහන්සේට තිබුණද? අතීත වර්තමාන අනාගත වශයෙන් උන්වහන්සේ මේවා කෙසේ දැක්කාද විග්‍රහ කළාද. ඒ නිසා අධම්මික සූත්‍රය තුළින් බුදුන් දකින්ට ලැස්ති වෙන්න වෙන කවුරුවත් දකින්ට නෙවෙයි. කාටවත් චෝදනා කරන්න එහෙම නෙවෙයි. මොකද හේතුව පින්වතුනේ බණක් අවසාන වෙනකොට ඒ බණ අහපු බහුතරයක් දෙනාට ඒ බණ තේරෙන්නෙ නැහැ. තේරුණේ නැහැ. තේරුම් ගන්න බැහැ හේතු සාධක තියෙනවා. බණ අහන්න ලැහැස්ති වෙනකොටම දෘෂ්ටිගතවෙලා අවසානයි. දැන් මේ නොබෝදා දිනක අප විහාරස්ථානයට ආසන්න විහාරස්ථානයක ස්වාමීන් වහන්සේනමක් වැඩලා ධර්ම දේශනාවක් කරලා තිබුණා බොහොම ගාම්භීර. එය ශ්‍රවණය කරපු අය අතරෙ බහුතරයක් දෙනෙක් අපිට මුණ ගැහිලා සහ අපිට කතාකරලා අහපු ප්‍රශ්නයක් තිබුණා. මොකක්ද අහපු ප්‍රශ්නය? අසවල් පන්සලේ අසවල් දවසේ ධර්ම දේශනාවකට දුර බැහැර අසවල් ස්වාමීන් වහන්සේ වැඩම කළා. බණ නම් හොඳයි. බණ ගැඹුරුයි. සරලත් ඒවගේම තේරුණත්. ඒක නෙවෙයි ස්වාමීන් වහන්ස උන්වහන්සේ බණට වැඩියෙ එළලා තිබ්ච්ච පාවඩයේ දාලා තිබ්ච්ච මල්මතින්. මල් පාගන එක හොඳ නෑ නේද? බලන්න පින්වතුනේ සම්මක්ජාති මිනිස්සුන්ට ධර්මය අවබෝධ කරගන්න පුළුවන්ද කියලා. තව කෙනෙකුට මල් දාන්න තරම් කෙනෙකුගෙ හදවතේ තිබෙනවා නම් ගෞරවයක් ඔහුගෙ ගෞරවය ප්‍රකාශ කරන විදිහ තමයි මල් දැමීම. මල් මත වඩිනවාද නැද්ද කියන එක තීරණය වන්නේ වඩින කෙනාගේ ගුණය පදනම් කරගෙන. එතකොට පැය ගාණක් බුදුහාමුදුරුවෝ වැඩලා ධර්ම දේශනා කළත් වැඩක් නැහැ භාග්‍යවතුන්වහන්සේවත් රූපයෙන් එකපාරටම හඳුනාගන්න බැහැනේ. ඔන්න භාග්‍යවතුන් වහන්සේ වැඩම කළා. උන්වහන්සේගේ අධිෂ්ඨානයක් තිබුණ නිසා

පුණ්‍යවන්ත මහිමයක් නිසා උන්වහන්සේ වඩිනකොට නෙළුම් මල් පිපුණා කියන්නෙ. එතකොට බණ අහගෙන ඉඳලා කියයි බණක් නම් කිව්වා ශ්‍රමණයෙක් ඇවිල්ලා. බණ නම් හොඳයි. ශ්‍රමණයත් ගොඩක් ලස්සනයි. කට හඬත් හරිම මිහිරියි. හැබැයි ඒ ශ්‍රමණයා නෙළුම් මල් පාගෙන තමයි ආවේ. දැන් බලන්න දෘෂ්ටියක ඉඳගෙන නේද කියලා බණ අහලා තියෙන්නෙ. එතකොට කවදාවත් ඒ ධර්මය අවබෝධ කරන්න පුළුවන්ද? මොනවද මේ අල්ලා ගත්තේ. අල්ලා ගත්තේ වුවමනා තැනින් නෙමේ. අනවශ්‍ය තැනින් අල්ලා ගන්නේ. ඊට පස්සේ හදාගන්නෙ ද්වේෂය. ඊට පස්සේ කරන්නෙ විවේචනය. ධර්මය ගැන නෙවෙයි ඒ විවේචනය. ධර්මයයි විවේචනය කරන්ට ඕනෙ. ධර්මයයි සංවාද කරන්ට ඕනෙ. ධර්මයයි සාකච්ඡා කරන්ට ඕනෙ. බණ අවසාන වෙලා යනකොට කතා කර කර යන්ට ඕනෑ ඒ අහපු බණ ගැන. බණ නෙවෙයි කතා කර කර යන්නෙ මල් පාගපු එක ගැන. ලෝකයේ බහුතරයකට බණ අවබෝධ කරන්න බැරිවෙච්ච හේතුව තථාගත මගේ බුදු හාමුදුරුවෝ පැහැදිලා කළා. කුෂ්ට රෝගියෙක් එනකම් විශාල පිරිසක් අවිල්ලා ඉදෙද්දිත් භාග්‍යවතුන් වහන්සේ බණ පටන්ගත්තේ නැහැ. එතකොට සියලු දෙනා අහනවා ඇයි බුදු හාමුදුරුවනේ බොහෝ අය ඇවිල්ලනෙ බණ පටන් ගන්න පුළුවන්නෙ. තාම ඕන කරන කෙනා ආවෙ නෑනෙ. ටිකක් වෙලා යනකොට ළගක ඉන්න බැරි ළගින් වාඩි වුණොත් නහයක් තියාගෙන ඉන්න බැරි තරමට මුළු ශරීරයේම කුෂ්ටයක් හැදිච්ච කුෂ්ට රෝගියෙක් ඇවිල්ලා වාඩි වුණා. භාග්‍යවතුන් වහන්සේ බණ පටන් ගත්තා. ධර්ම දේශනා කළා. ධර්ම දේශනා අවසන් වුණා.

පින්වතුනේ සියල්ලෝම නැගිටලා ගියා. කුෂ්ට රෝගියා විතරයි ඉතුරු වුණේ. එදා ඒ සිද්ධිය සලකා භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළා මේ මහා පිරිසක් හිටියට මේ හිටිය පිරිස අතරෙන් ධර්මය අවබෝධ කර ගත්තේ එක්කෙනයි.

ඔහු කල් ඇතිව මම හඳුනා ගත්තා. ඒ නිසා ඔහු එනකම් මම හිටියා. ඔහු එනකම් ඔහුට බණ කියන්න භාග්‍යවතුන් වහන්සේ කැප කිරීමක් කළා.

පින්වතුනේ, ඒ නිසා වෙන වෙන දේවල් හිත්වල තියාගෙන බණ ඇහුවහම බණ අවබෝධ කරගන්න බැහැ. ඒ නිසා අධම්මික සූත්‍රය ගැන අහනකොටත් ඔලුවෙ තියෙන අනික් ඒවා අහක දාන්න. මේ වෙන දෙයක් ඔලුවෙ තියාගෙන පක්ෂ, පාට දේශපාලනය පුද්ගලයෝ ඔලුවෙ තියාගෙන අධම්මික සූත්‍රය අහපු ගමන්ම අපිවත් දාවි එක එක දෘෂ්ටිවලට හාමුදුරුවෝ අහවල් දේශපාලන මතය දරණ කෙනෙක්ය කියලා. අද එහෙම දාන්න පුළුවන් වෙයි. ඒකයි මේ කල් ඇතිව කිව්වේ. අධම්මික සූත්‍රය අද විග්‍රහ කරලා අවසන් කරන්න බැහැ. ආරම්භයක් හදන්නෙ. කල් ඇතිව මතක් කරන්නෙ සිත් වල තිබෙන දේ අයින් කර ගන්ට. සිත්වල තිබෙන වැරදි දෘෂ්ටි අයින් කර ගන්ට. දාගෙන ඉන්න පාට කණ්ණාඩිය අයින් කරන්න. අයින් කරගෙන පාට පැත්තකින් තියලා උපේක්ඛාවෙන් මධ්‍යස්ථව ඉඳගෙන මේ පිළිබඳ අවධානය යොමු කරන්න අධම්මික සූත්‍රයට.

"යස්මිං භික්ඛවේ සමයේ රාජානෝ
අධම්මිකා හොන්ති."

ඔන්න තේරුම් ගන්න "යස්මිං භික්ඛවේ සමයේ රාජානෝ අධම්මිකා හොන්ති." භික්ඛවේ මහණෙනි, පින්වතුනේ යම් කලෙක යස්මිං - සමයේ යම් කලෙක යම් වෙලාවක යම් තැනක "රාජානෝ අධම්මිකා හොන්ති." රජ්ජුරුවෝ අධාර්මික වෙයිද රජ්ජුරුවෝ අධාර්මික වෙත්ද එතකොට බහු වචනයක් හැබැයි තියෙන්නෙ. රජ්ජුරුවෝ "හොන්ති" - වෙත්ද යම් කලෙක රජවරු ඒ ඒ රටවල් පාලනය කරන රජවරු අධාර්මික වෙත්ද "රාජයුත්තාපි තස්මිං සමයේ අධම්මිකා හොන්ති." රාජයුක්තාපි - රජ්ජුරුවෝ ප්‍රධානියනෙ. රජවරු අධාර්මික වෙච්ච ගමන් රජවරුන්ට පහළින් ඊළඟට ඉන්න අය තමයි

රාජයුත්තාපි කියලා කිව්වේ. බහු වචනයක්. බොහෝ අය. රාජ පුරුෂයෝ ලොක්කෝ අධාර්මික වෙනකොට ලොක්කන්ට පහළින් ඉන්න අය ටික ඊළඟට අධාර්මික වෙනවා කියලානෙ මේ කියන්නෙ. ඒ එතකොට බලන්න පාලකයෙක් ඉන්න කොට පාලකයාට ඊළඟට ඉන්න ප්‍රධානියෝ ටික ඊළඟට අධාර්මික වෙනවා. රජු අධාර්මික වෙන කොට "රාජයුත්තාපි අධම්මිකා හොන්ති." එහෙනම් අමාත්‍ය මණ්ඩලය අධාර්මික වෙනවා. "තස්මිං සමයේ අධම්මිකා හොන්ති. රාජයුත්තාපි."

රජ්ජුරුවන්ට පහළින් ඉන්න පිරිස ඊට පස්සෙ අධාර්මිකයි. දැන් ඔන්න බලන්න සිදු වෙච්ච සිදුවීම. මේක බොහොම පටිච්ච සමුප්පන්න ක්‍රම වේදයකට යන්නෙ පින්වතුනේ. ඒ කියන්නේ එකකට එකක් පිටිපස්සේ දම් වැලක පුරුක් ඇමුණුවා වගේ එකක් හේතු කරණ කොටගෙන තව එකක් හටගන්නවා. රජවරු අධාර්මික වුණහම රජවරුන්ගේ අමාත්‍ය මණ්ඩලය අධාර්මික වෙනවා. "රාජයුත්තේසු අධම්මිකේසු බ්‍රාහ්මණ ගහපතිකාපි තස්මිං සමයේ අධම්මිකා හොන්ති" යම් කලෙක පින්වතුනේ රාජපුරුෂයෝ නැත්නම් අමාත්‍යවරු අධාර්මික වෙනවද ඊට පස්සෙ "බ්‍රාහ්මණගහපතිකා අධම්මිකා හොන්ති". බමුණු ගෘහපතීන් අධාර්මික වෙනවා. පූජ්‍ය පූජක පක්ෂය අධාර්මික වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඊළඟට ඉන්නෙ සාමාන්‍යයෙන් රටක නම් ව්‍යාපාරික ප්‍රජාව කියලා අපට ගන්න පුළුවන්. රජ්ජුරුවෝ ඉන්නවා අමාත්‍යවරු ඉන්නවා ඊට පස්සෙ රටක ව්‍යාපාර මට්ටමේ ඉන්න අය ඉන්නවා. එතකොට ලොක්කා හෝ ප්‍රධානියා හෝ ලොක්කියෙක් හෝ කවුරු හෝ එතන ඉන්න අය අධාර්මික වෙන කොට ඒ අයට ඒ හේතුවෙන් අමාත්‍යවරු අධාර්මික වෙනකොට ඒ හේතුවෙන් ඊළඟ පිරිස අධාර්මික වුණා. බ්‍රාහ්මණ ගෘහපතීන් බමුණු ගෘහපතීන්.

"බ්‍රාහ්මණ ගහපතිකේසු අධම්මිකේසු නෙගමජානපදාපි තස්මිං

සමයේ අධම්මිකා හොන්ති.”

ඔන්න පින්වතුනේ ඊළඟට බ්‍රාහ්මණ ගෘහපතීන් අධාර්මික වුණහම අර මම කියපු ඒ විදිහට නම් ව්‍යාපාරික ප්‍රජාව අධාර්මික වෙච්ච ගමන් පින්වතුනේ "නෙගමජානපදාපි අධම්මිකා හොන්ති.” ගම් නියම් ගම්වල ඉන්න ජනතාව අධාර්මික වෙනවා ඒ පාර. දැන් බලන්න ඉහළ ඉඳලා පහළට එකින් එක එකින් එක ආපු හැටි. රජ්ජුරුවන්ගෙන් අමාත්‍යවරුන්ට.

අමාත්‍යවරුන්ගෙන් බ්‍රාහ්මණ ගෘහපතීන්ට. ඔවුන්ගෙන් ගම් නියම් ගම්වල ඉන්න සාමාන්‍ය මිනිස්සු දක්වා අධාර්මික වුණා. ගම් නියම් ගම්වල ඉන්න සාමාන්‍ය මිනිස්සු දැන් අධාර්මිකයි.

"නෙගමජනපදේසු නෙගමජානපදේසු අධම්මිකේසු විසමං චන්දිමසූරියා පරිවත්තන්තේසු පරිවත්තන්ති.”

ගම් නියම් ගම්වල ඉන්න මිනිස්සු අධාර්මික වුණා කියලා කියන්නෙ. එතකොට රටක ඉන්න සාමාන්‍යයෙන් මිනිස්සු අතරින් බහුතරයක් අය දැන් ආධාර්මිකයි මේ කියන විදිහට. එතකොට මිනිස්සු ටික දැන් අධාර්මික නම් මිනිසුන්ගේ අධාර්මික ක්‍රියාකලාපය ඉස්සෙල්ලාම බලපාන්නෙ කාට කියලද සිතන් ඉන්නේ. දැන් ඉතින් සමස්ත රටකම බහුතරයක් අධාර්මිකයි. රජ්ජුරුවන්ගෙන් පටන් ගත්තම අමාත්‍යවරුන්ට ආවා. ව්‍යාපාරිකයන්ට ආවා. ගම් නියම්ගම්වල මිනිසුන් වෙනකම් ආවා. එතකොට සමස්ත රටේම මානව ප්‍රජාව අධාර්මිකයි. කාටද බලමු බලපාන්නේ මිනිසුන්ගේ අධාර්මිකකම. මෙය සොබාදහමට බලපානවා. සොබාදහමේ ප්‍රධානියෝ දෙන්නෙක් ඉන්නවා. ඒ දෙන්නට බලපානවා. ඒ කාටද පින්වතුනේ චන්දිම සූරියා ඉර හද දෙකට. මිනිසුන්ගේ අධාර්මික කම හේතු කරණ කොටගෙන ඉර හද දෙක විෂම විදිහට පරිවර්තනය වෙන්නට පටන් ගන්නවලු. ඇයි මෙතන කිව්වෙ " නෙගමජනපදේසු අධම්මිකේසු තස්මිං සමයේ විසමං චන්දිමසූරියා පරිවත්තන්ති.”

"චන්දිමසුරියා" ඉර හඳ දෙක විෂම විදිහට පරිවර්තනය වෙන්න පටන් ගන්නවා මිනිසුන් අධාර්මික වෙච්ච ගමන්. ඉරෙන් නිකුත් කරන කිරණ මිනිසාට අහිතකර වෙනවා. හඳෙන් නිකුත් කරන කිරණ මිනිසාට අහිතකර විදිහට බලපානවා. ඔන්න බලන්න පින්වතුනෙ ඊට පස්සෙ ඉර නිසා හටගන්න හඳ නිසා හටගන්න විවිධ ලෙඩ රෝග මිනිස්සුන්ට බලපාන්න පටන් ගන්නවා. දැන් ඉතින් ඔන්න සොබාදහමේ ප්‍රධානම දෙන්නා විෂම විදිහට පරිවර්තනය වුණා. මොකක්ද මේ ඉර හඳ දෙක විෂම විදිහට පරිවර්තනය වෙන්න හේතුව? ගම් නියම් ගම්වල මිනිස්සු අධාර්මික වෙච්ච නිසා. ඇයි ගම් නියම් ගම්වල මිනිස්සු අධාර්මික වුණේ? ව්‍යාපාරික ප්‍රජාව නැත්නම් බ්‍රාහ්මණ ගෘහපතීන් අධාර්මික වෙච්ච නිසා. ඇයි බ්‍රාහ්මණ ගෘහපතීන් අධාර්මික වුණේ? ඒ අමාත්‍ය මණ්ඩලය අධාර්මික වෙච්ච නිසා. ඇයි අමාත්‍ය මණ්ඩලය නැත්නම් රාජ පුරුෂයන් අධාර්මික වුණේ? ඒ රජවරු අධාර්මික වෙච්ච නිසා. දැන් බලන්න මම මුල ඉඳලා අගට අග ඉඳලා මුලටයි ගියා ටිකක්. තාම ආරම්භය විතරයි. පින්වතුනේ දැන් මිනිසාගේ ක්‍රියා කලාපය ඉර හඳ දෙකට බලපෑවා. ඉර හඳ දෙක විෂම විදිහට පරිවර්තනය වුණා. තාක්ෂණය දියුණු කරනවාය කියලා විවිධ දේ හැදුවා. මිනිස්සුන්ගේ යහපතටයි කිය කියා හැදුවේ. හදාපු දේවලින් නිකුත් කරපු අපද්‍රව්‍ය නරක කිරණ නොයෙක් දේවල් ඕසෝන් ස්තරයට බලපෑවා. ශීතකරණයක් හදන්න ගන්න සමහර දේවල් ඕසෝන් ස්තරය පළුදුවෙන්න බලපෑවා. න්‍යෂ්ටික අත්හදා බැලීම් ආදිය සිදු කරනවා. ඒවායින් වායු ගෝලයට දැඩි තර්ජන එල්ලවෙනවා. අන්න මිනිස්සුන්ගේ අධාර්මික ක්‍රියාකලාපය. මිනිස්සුන්ගේ අධාර්මික ක්‍රියා කලාපය නිසා ඉර හඳ දෙක ඔන්න විෂම විදිහට පරිවර්තනය වුණා. ඉතින් ඉර හඳ විෂම වුණාට පස්සෙ එතනින් එහාට මොනවද වෙන්නෙ කියන එක අද දවසෙ විග්‍රහ කරන්ට කාලය මදි. එතකොට අධම්මික සූත්‍රය පිළිබඳව අපට දීර්ඝ වශයෙන් දැනගන්න ඉදිරි

කාලය ප්‍රයෝජනයට ගන්ට වෙනවා. ඒ පිළිබඳව අපි දීර්ඝව ඉදිරි අනුශාසනාවලදී ශ්‍රවණය කරමු.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

මෙලොව වශයෙන් මේ සෑම සියලු දෙනාටම දීර්ඝායුෂ ලැබේවා. පරලොව සුගතිය උදා කරගෙන මියගිය සියලු ඥාතීන්ට අපි හැමෝටම නිවන් සුව විඳින්නට මේ පිං පාරම ධර්මයක්ම වේවා කියලා සාධු කියලා ප්‍රාර්ථනා කරමු.

ආකාසට්ඨාච භුම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු ලෝක සාසනං
චිරං රක්ඛන්තු දේසනං
චිරං රක්ඛන්තු මං පරන්ති.

# ධර්ම දේශනා - 2

## (2017.06.07 දින ධර්ම දේශනාව)

සමන්තා චක්ක වාලේසු
අත්‍රා ගච්ඡන්තු දේවතා
සද්ධම්මං මුනිරාජස්ස
සුනන්තු සග්ග මොක්ඛදං

ධම්මස් සවන කාලෝ අයං භදන්තා
ධම්මස් සවන කාලෝ අයං භදන්තා
ධම්මස් සවන කාලෝ අයං භදන්තා

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස ///

" විෂමපාකිනි භික්ඛවේ සස්සානි
මනුස්සා පරිභුඤ්ජන්තා අප්පායුකා ච
හොන්ති, දුබ්බණ්ණා ච
දුබ්බලා ච බහුආබාධා ච තීතී ”

ධර්මශ්‍රවණාභිලාෂී සැදැහැති වාසනාවන්ත කාරුණික පින්වන්ති,

ශ්‍රාවක පින්වත් ඔබ සියලු දෙනාටම ධර්මාවබෝධයෙන් නිවන් පසක් කර ගැනිම සඳහා වටිනා කියන ඉලක්කයක් වෙත යොමු කිරීම සඳහා පණ ඇති සේම පණනැති කල්‍යාණ මිත්‍රයින් ඉතාම වැදගත් පින්වතුනේ. මේ අතරේ දියුණුව අභිවෘධිය සලසන අපායෙන් අපිව වළකාලන සුගතිය කරා අපිව පමුණුවන සදාකාලික සැපය අපට උරුම කරන අචේතනික කල්‍යාණ මිත්‍රයා තථාගත ශ්‍රී සද්ධර්මයයි. පින්වත් ඔබට තථාගත ශ්‍රී සද්ධර්මය දෙසවනට ළං කරන මිත්‍රයා ජාතියේ නාළිකාවයි. අදත් ධර්ම දක්ෂිණාවේ

දායකත්වය ලබාගෙන දානමය ආනිශංස සඳහා හිමිකම් කියන්නට පින්වතුන් කිහිප පොළක්ම ඒ භාග්‍ය උදාපත් කර ගෙන තිබෙනවා. ඒ අතරේ අනුර කපුගම මහත්මා ස්වාමිපුරුෂයාණන් වශයෙන් ඒ වගේම දිදුල තාරුක පුතණුවන් විශේෂ දායකත්වයක් ගෙන කටයුතු කරනු ලබනවා. ඒ වගේම අංක 143, මුල්ලේරියාව, උතුර පදිංචි ජී.එල්. ජයසිරි පෙරේරා මහත්මානන් විසින් දායකත්වයක් ගෙන කටයුතු කරනවා. ඒ වගේම හොරණ සීලරතන මාවත නොම්මර 3/16 ලිපිනයේ පදංචි නුවන් බංඩාර වික්‍රමසිංහ මහත්මා සහ දිනුෂ්කා ජයතිලක මහත්මිය විසින් තවත් දායකත්වයක් ගෙන කටයුතු කරනු ලබනවා. මෙකී පින්වතුන්ගේ දායකත්වයන් ගැනීමේ අරමුණ ආශිර්වාද පුණ්‍යානුමෝදනා පූර්වකව ධර්මානුශාසනාව අවසානයේ දී සිදු කරන්නට ඉඩ තබා ගනිමින් අවධානය අපි යොමු කරමු ධර්ම දක්ෂිණාවට.

පින්වතුනේ,

හෙට දවසේ උදාවන්නේ පොසොන් පුර පසළොස්වක පොහොය. ලාංකිය බෞද්ධ ඉතිහාසය තුළ විශාල පරිවර්තනයක් සිදුවෙච්ච දවසක් විදිහට ඉතිහාස ග්‍රන්ථවල පොසොන් පෙහොය පිළිබඳව සටහන් කරලා තිබෙනවා. යම් යම් කරුණු කාරණාවන් පිළිබඳ ඉතිහාස ග්‍රන්ථ දක්වන සටහන්වල පරස්පරතාවයන් හඳුනා ගැනීමට තිබුණත් අපිට පින්වතුනේ යම් නිගමනයකට එන්ට පුළුවන්කම තිබෙනවා මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකා ගමනය අප සමාජය තුළ ආගමික වශයෙන් විශාල පුනරුදයක් ඇති කිරිම සඳහා හේතු භූත වෙච්ච කාරණාවක් වග. තථාගත ලොව්තුරු මගේ බුදුරජාණන් වහන්සේ සොළොස්මස්ථානවලට වැඩම කරමින් දහම් දේශනා කරමින් එවකට මේ ශ්‍රී ලංකාවාසී සියලුම ජනතාවට තථාගත ශ්‍රී සද්ධර්මය සංනිවේදනය කිරීමේ කටයුත්ත භාග්‍යවතුන් වහන්සේ විසින් ආරම්භ කරලයි තිබුණේ. උන්වහන්සේගේ ඒ ආරම්භය උන්වහන්සේ නිසාවෙන් තෙරුවන් සරණ ගොස් සිටි

ශ්‍රී ලංකාවාසී ජනතාව මහින්දාගමනයත් සමඟම තව තවත් යම්කිසි විදිහක බෞද්ධ සංස්කෘතිකමය වශයෙන් යමකට උරුමකම් කියමින් තම ජීවිතය මහා සංස්කෘතික පරිවර්තනයකට යොමුකර ගත්ත වගක් ඉතිහාස ග්‍රන්ථවලින් පැහැදිලිව පෙනෙනවා. කෙසේ හෝ නමුත් පින්වතුනේ සම්මත ඉතිහාසය තුළ මහින්දාගමනය කියලා කියන්නේ අපිට නොමැකෙන ඓතිහාසික වටිනාකමක් සටහන් කරන ලද පිටුවක්. ඒ පිළිබඳව ගැඹුරින් කල්පනා කරන්නට ගැඹුරින් මෙනෙහි කරන්නට ඒ වගේම සාකච්ඡා කරන්නට පින්වන්ත ඔබට පවරමින් අපි බදාදා ධර්මානුශාසනාවෙන් කලක ඉදලාම උත්සාහවත් වන්නේ ශ්‍රී සද්ධර්මය තුළින් භාග්‍යවතුන් වහන්සේ සොයා ගැනීමට. ත්‍රිපිටකය හාරා අවුස්සමින් ඒ අතරෙන් ගෞතම බුදුරජාණන් වහන්සේව දැකගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුක්තව බදාදා ධර්මානුශාසනාව ශ්‍රවණය කරන කාරුණික පින්වතුන් අද දවසේ බලාපොරොත්තු වන්නේ පසුගිය සතියේ බදාදා ආරම්භ කරන්නට යෙදුණ අධම්මික සූත්‍රයේ ඉතුරු කොටස් ටික ශ්‍රවණය කරන්නට.

පසුගිය බදාදායින් පසුව විවිධ පළාත්වල ධර්ම දේශනාවලට වැඩම කරන්නට යෙදිච්ච මාහට හමුවුණු ධර්ම දක්ෂිණාවේ ශ්‍රාවක පින්වතුන් අධම්මික සූත්‍රයෙන් ඉතුරු බණටික අහන්න අද බදාදා දවස එනකම් පුන පුනා බලාගෙන ඉන්න බව බොහෝ අය ප්‍රකාශ කරන්න යෙදුණා.

පින්වතුනේ, තවමත් අපිට සම්මතයේ තිබෙන ස්වභාවික විපත් යනුවෙන් හදුන්වන සොබාදහමේයම් යම් උපක්‍රමවලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. තවමත් ඒ පිළිබඳව අපට බිය පහව ගිහිල්ලා නැහැ. කඳු නායයන එක ගං වතුර පිටාර ගලන එක වසංගත රෝගවලට පත්වෙන එක අකුණු සැර වදින එක ආදීකොට ගත්ත සම්මුතියේ ස්වභාවික විපත් යනුවෙන් හඳුන්වන දෙය ධර්මයට අනුකුල නම් පින්වතුනේ ස්වභාවික විපත් කියලා දෙයක්

සොයා ගන්ට අමාරුයි. සම්මුතිය තුළ ස්වභාවික විපත් යන්න අර්ථ දක්වන්නේ කිසිවකුගේ මෙහෙයවීමකින් තොරව සොබාදහම විසින්ම සිදුකරන කාර්යයක් කියන අර්ථයෙනුයි. ලොව්තුරු මගේ බුදුරජාණන් වහන්සේ පින්වතුනේ ඉස්සෙල්ලම පහර ගහන්න යෙදුණේ එහෙම නැත්නම් නිවැරදි කළේ මේ සමාජයේ තිබිච්ච ප්‍රබලම වැරදි මතයක්. ඒ තමයි යම් යම් දේ නෙවෙයි හැමදේම ඉබේ සිදුවෙනවාය.

"අසයං කාරං අපරං කාරං අදිච්ච සමුප්පන්නං". ආදී විදිහට කිසිවකුගේ මෙහෙය වීමකින් තොරව හැමදේම ඉබේ සිදුවන්නේය යන නරක නපුරු ඉගැන්වීම. භාග්‍යවතුන් වහන්සේ සකාරණව පින්වතුනේ ප්‍රතික්ෂේප කරන්ට යෙදුණා. මේ ලෝකයේ කිසිවක් ඉබේ සිදුවෙන්නෙ නැති බවත් සිදුවෙන සෑම දෙයකටම හේතුවක් හෝ හේතු කීපයක් පදනම් වන බවත් හේතු ඵල දහමෙන් මනාව පැහැදිලි කළ ලොව එකම ශාස්තෘන් වහන්සේ තථාගත මගේ බුදුරජාණන් වහන්සේමයි. ඒ නිසා ව්‍යවහාරයේ ස්වභාවික විපත් යනුවෙන් හඳුන්වන දේ ඉබේ සිදුවෙන ඒවා නෙවෙයි. ඒවා මිනිසුන්ගේ ක්‍රියාකාරකම්වලට ප්‍රතිචාර දැක්වීම් වශයෙන් සොබාදහම සිදු කරන යම් යම් උපක්‍රම විදිහටයි දක්වන්න පුළුවන්කම තියෙන්නෙ. මිනිසුන්ගේ ක්‍රියා මිනිසුන්ගේ සිතුවිලි සමස්ත සොබාදහමට එක එල්ලේම බලපාන බව අධම්මික සූත්‍රයෙන් මනාව පැහැදිලි වෙනවා.

පින්වතුනේ, මේ සොබාදහම පිළිබඳ දේශනාවමයි තථාගත ශ්‍රී සද්ධර්මය කිව්වේ. ලොව කොතෙක් ශාස්තෘවරු බිහි වුණත් ඒ සියලුම ශාස්තෘවරු පැහැදිලි කරන්ට යෙදිච්ච සියලුම ඉගැන්වීම් ඒ ඒ ශාස්තෘවරුන්ගේ නිර්මාණ වුණත් තථාගත බුදුරජාණන් වහන්සේ උගන්වපු බණට බුදුබණ කියන වචනය ව්‍යවහාර කළාට පින්වතුනේ බුදුහාමුදුරුවන්ගේ බණ එහෙම නෙවෙයි ඒ. බුදුබණ යනුවෙන් මේ ධර්මයට ව්‍යවහාරයක් දුන්නට භාග්‍යවතුන් වහන්සේගේ බණක් එහෙම එතන නැහැ. මේ ලෝකයේ තිබෙන යථාර්ථයයි

තථාගතයන් වහන්සේ පැහැදිලි කරලා දුන්නෙ. අනිච්ච කියන්නෙ බුදුහාමුදුරුවන්ගේ බණක් නෙවෙයි. දුක්ඛ කියන්නෙ බුදුහාමුදුරුවන්ගේ බණක් නෙවෙයි. අනන්ත කියන්නෙ බුදුහාමුදුරුවන්ගේ බණක් නෙවෙයි. වයසට යන එක කෙස් පැහෙන එක හම රැළි වැටෙන එක මේ ආදී විදිහට ලෝකයේ තිබෙන යථාර්ථයේ ස්වභාවයයි භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව. ව්‍යවහාරයට අපි බුදුබණ කියලා කිව්වට භාග්‍යවතුන් වහන්සේගේ නිර්මාණයක් නැහැ කොතනකවත්. මේ ස්වභාවයේ තිබෙන දේ එලෙසම ප්‍රකාශ කිරීම පමණයි භාග්‍යවතුන් වහන්සේ කරලා තිබෙන්නෙ. එනිසයි මේ බුදුබණ කියන වචනයෙන් හඳුන්වන ශ්‍රී සද්ධර්මය කවදාවත් වෙනස් නොවන්නෙ. අකාලික දහමක් බවට පත්වුණේ සොබාදහම නිසයි. බුදු බණ යනු සොබාදහමයි. භාග්‍යවතුන් වහන්සේ සොබාදහමට අනුගතව අනුකූලව ජීවත් වුණා. දේශනා කළා. අනුගාමිකයන්ට සොබාදහමට අනුගත වන ලෙස අවවාද කළා. විනය නීති රීති පැනෙව්වා. ඒ විදිහට කටයුතු කරන ලෙස බොහෝ කොට උන්වහන්සේ තේරුම් කරලා දුන්නා.

මිනිසා කියන්නෙ සොබාදහමේ නිර්මාණයක්. සියලුම සත්වයන් සොබාදහමේ නිර්මාණයක්. ගහ කොළ සතා සිවුපාවා ඇල දොළ සොබාදහම. භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව ඒ සොබාදහමමයි. පින්වතුන් නිතර පාවිච්චි කරන ඔබට බෙහෝ කොට කට පාඩම් පිරිත් සූත්‍රය කරණීය මෙත්ත සූත්‍රය. බලන්න පින්වතුනේ,

> "තසා වා ථාවරා වා අනවසේසා
> දීඝා වා යේ මහන්තා වා
> මජ්ඣිමා රස්සකාණුකථූලා."

ගාථා දෙකේම තියෙන්නෙ එහෙම පිටින්ම සතුන්ගේ නාම ලේඛනයක්. අන්න සොබාදහම. ඒ සොබාදහම. භාග්‍යවතුන් වහන්සේගේ දහම සොබාදහම. ඒ නිසා සොබාදහමේ විශිෂ්ට නිර්මාණයක් වන මිනිසා සොබාදහම රකින තුරාවට සොබාදහමේ

ප්‍රතිචාර අයහපත් විදිහට ඔහුට ගෙන දෙන්නෙ නැහැ පින්වතුනේ. පරිසරය නිතරම සොබාදහම විසින් සමතුලිතව පවත්වාගෙන යෑම සිදු කරනු ලබනවා. ඒ නිසා කන්දක් වුවමනා තැනට කන්දක් සොබාදහම හදල දීලා තියෙනවා. තැන්න වුවමනා කරන තැනට තැන්නක් සොබාදහම නිර්මාණය කරලා දීලා තියෙනවා. දොළ පාර වුවමනා කරන තැනට දොළ පාර ද ගඟ වුවමනා කරන තැනට ගඟද ඇල වුවමනා කරන තැනට ඇලද ආදී විදිහට සොබාදහම මේ සියල්ල නිර්මාණය කරලා දීලයි තියෙන්නෙ. සොබාදහමේ වගකීම තමයි සොබාදහම විසින්ම නිර්මාණය කළ සත්වයාට පුද්ගලයාට කන්න දෙන එක. බොන්න දෙන එක. හුස්ම දෙන එක. බෙහෙත් දෙන එක. සොබාදහම එම වගකීම මැනවින්ම ඉටු කරනවා. සොබාදහම විසින් නිර්මාණය කළ සියලුම සත්වයන්ට අවශ්‍ය සියලුම ආහාර පානාදිය සොබාදහම විසින්මයි හදලා දීලා තියෙන්නෙ. ආහාර විතරක් මදි හුස්ම ඕනෑ. ඒ අවශ්‍ය වාතය ලබලා දෙන්නෙ සොබාදහම. ආහාර හුස්ම තිබුණාට වැඩක් නැහැ ජලයත් ඕනෑ. සොබාදහම ඒකත් නිර්මාණය කරලා දීලා තියෙනවා. ඔය සේරම තිබුණාට මට වැඩක් නැහැ සත්වයෝ අසනීප වෙනවා නම් අන්න සොබාදහමෙන් බෙහෙත් ටිකත් නිර්මාණය කරලා දීලා තියෙනවා. සමහර ගහක පොතු බෙහෙත. සමහර ගහක දළු බෙහෙත. සමහර ගහක මල් බෙහෙත. සමහර ගහක සුඹුළු බෙහෙත. සමහර ගහක මුල්, අල බෙහෙත. සමහර ගහක පස් පංගුවම බෙහෙත. සොබාදහම. ගෙදරක හදන සුනඛයාට බඩේ කැක්කුම හැදුණහම ඔහු ගියෙ නැහැ කවදාවත් පින්වතුනේ පශු වෛද්‍යවරයා හමුවෙන්න. ඔහු පශු වෛද්‍යවරයාගේ නළාවට හෝ වෙනත් ස්කෑන් එකකට භාජනය වුණේ නැහැ. ගෙදර හදන බල්ලාට බඩේ අමාරුවක් අජීර්ණයක් ආවා නම් එයා ගිහිල්ලා කුඹුරු තියෙන දවසක නම් සමහර වෙලාවට ගොයම් පැළ කීපයක් කනවා. නැත්නම් බැලතණ ටිකක් කනවා. එසැනින් ඔහු කාපුවා ආපස්සට

වමාරනවා. බඩේ තිබ්බච ඒ අජීර්ණයට හේතු වෙච්ච අපත්ති දේ උං වමාරලා දානවා. අසනීපය සනීපයි. ගෙදර හදන පූසා අසනීප වුණහම කුප්පමේනියා ගහක් දෙකක් ගලවලා දුන්නා නම් එයා ඒක කනවා. සනීප වෙනවා. මම උදාහරණ දෙකක් මතක් කළේ. සොබාදහමේ නිර්මාණයක් වන සතා සිවුපාවා පවා නඩත්තු කිරීමේ වගකීම සොබාදහමමයි දන්නෙ. ඒ නිසා මේ සොබාදහම සමතුලිතව පවත්වාගෙන යෑමේ වගකීමත් සොබාදහමටමයි තියෙන්නෙ.

අපි කඳු පහත් කිරීම ඇළ වේලි හරස් කරලා ජලාශ ඉදිකිරීම ඇතුළුකර ගත්ත සොබාදහම විසින් හදලා දීපු තත්වයන් විෂම කිරීම හේතුවෙන් සොබාදහම පරිසරය සමතුලිත කිරීමට යම් යම් උපක්‍රම පාවිච්චි කරනවා. ඒ උපක්‍රමවලට සත්වයා මිනිසා ගොදුරු වෙනවා. ඒ ගොදුරු වීමට මිනිසා විසින් පින්වතුනේ නමක් හදාගෙන තියෙනවා ස්වභාවික විපත කියලා ඒක අපිමයි හදාගත්තෙ. මේ ලෝකයේ නිර්මාණය වීම පිළිබඳව තථාගත මගේ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමේ තිබෙන්නෙ පින්වතුනේ

"චිත්තේන නීයතී ලෝකෝ,
චිත්තේන පරිකස්සති."

බලන්න ඉගැන්වීම. මේ පෘථිවිය නිර්මාණය වුණේම සිත නිසාය. සිතුවිලි නිසාය. බොහෝ අය දීර්ඝ කාලයක් ප්‍රාර්ථනා කිරීම, සිතීම මෙනෙහි කිරීම පදනම් කරගෙන භෞතිකයක් ගොඩ නැගුණා. ඒ භෞතිකය පඨවි ආපෝ, තේජෝ, වායෝ. එය සම්බන්ධ වෙනවා දිගින් දිගට දම්වැලක පුරුක් අමුණා එනවා වාගේ පෙර භවයකට පවා. කෙසේ හෝ වත්මන් පෘථිවිය නිර්මාණය වන්නෙ තවත් බොහෝ අයගෙ ආභස්සර බ්‍රහ්ම ලෝකයේ ඉන්න ජීවීන්ගේ ප්‍රබල සිතුවිලි ධාරාවන් පදනම් කරගෙන. "චිත්තේන නීයතී ලෝකෝ." ඔන්න සිත නිසා ලෝකය නිර්මාණය වෙනවා. සිතේ ක්‍රියාකාරිත්වය අනුව ලෝකය පරිවර්තනය වෙනවා. ඒක එහෙම නම් පින්වතුනේ මේ සොබාදහමේ සියලු දේවල් වලට මිනිසුන්ගේ

සත්වයන්ගේ සිතුවිලි දැඩි සේ බලපානවා. එය තවත් සනාථ කරන තැනක් තමයි අපේ පැරැන්නෝ නිතර කිව්වා කටහඬ ඇහෙන තැන ගහේ එල දරනවා වැඩියි කියලා අන්න මිනිස්සුන්ගේ සිතුවිලි සොබාදහමට බලපාපු තැන. මල් ගහක් හිටෙව්වත් කට හඬක් ඇහෙන ප්‍රමාණයක දුර නම් ඒ මල් ගහේ දරණ එල වශයෙන් පිපෙන මල් ඉතාමත්ව ඉහළ මට්ටමක තියෙන්නෙ. එල දරණ ගසක් සිටෙව්වා නම් කටහඬ ඇහෙන මානයේ තිබෙන එම ගස්වල ගෙඩි වැඩියි කියන බව අතීතයේ අපේ මුතුන්මිත්තෝ දැඩිව විශ්වාස කරන්න යෙදුණා. බලන්න මිනිසුන්ගේ යහපත් සිතුවිලි පරිසරය තුළ යහපත් ආකාරයට පරිවර්තනය වෙනවා. ඒ වගේමයි නරක නපුරු සිතුවිලි නිතරම සිතන එනිසා කටින් පිටවෙන වචන නරක නපුරු ඒවා නම් එවන් පරිසරය නිතරම දූෂිත වෙලා. වායුගෝලය දූෂිත වෙලා. ගහකොළ නිතරම දූෂිත වෙලා මලානික වෙලා. ඒ නිසා පුද්ගලයාට සත්වයාට අහිතකර පරිසරයක් ගොඩනැගිලා. මෙන්න මේ අනුසාරයෙන් බලනකොට අපි පසුගිය සතියේ විග්‍රහ කරන්නට යෙදිච්ච " රාජා භවතු ධම්මිකෝ " කියන වදන මොන තරම් නම් යථාර්ථවාදී බණපදයක්ද කියලා පින්වතුන්ට වැටහෙන්න ඕනෙ.

අවධානය යොමු කරමු පින්වතුනේ එහෙම නම් අංගුත්තර නිකායේ දෙවෙනි පොතේ අධම්මික සූත්‍රයට. මිනිසුන්ට අවසානයේදී පත්වෙන්න සිදුවන ඉරණම තමයි මම මාතෘකාවට අදත් තබා ගත්තෙ. අවසානයේ මිනිසුන් මුලට මිනිසුන්ගේම ක්‍රියාකලාපය සොබාදහමට බලපා ඇත. සොබාදහමේ උපක්‍රමය පරිසර සමතුලිතභාවය රැකීම. එය ස්වභාවික විපත්තීන් වශයෙන් මිනිසුන් දරලා එහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේ මිනිසුන්ම

"විසමපාකිනී භික්ඛවේ සස්සානි
මනුස්සා පරිභුඤ්ජන්තා. "

විෂම වෙච්ච ශස්‍යයන් අනුභව කරන මිනිස්සු "අප්පායුකා ච හොන්ති" ආයුෂ අඩු අය බවට පත්වෙනවා. "දුබ්බණ්ණා ච හොන්ති" දුර්වර්ණ පුද්ලයෝ බවට පත්වෙනවා. "දුබ්බලාච හොන්ති " බලය දුර්වල වෙච්ච දුර්වල පුද්ගලයෝ බවට පත්වෙනවා. "බහුආබාධා ච හොන්ති." ආබාධ ගොඩක් තියෙන අය බවට පත්වෙනවා. මේ අවසාන ඉරණමට යම් තරමක ආරම්භයක් වශයෙන් මූල සාධකයක් වශයෙන් අධම්මික සූත්‍රයේ උගන්වන කාරණාවේ මුල සටහන් වෙලා තිබෙන්නෙ

"යස්මිං හික්ඛවේ සමයේ රාජානෝ අධම්මිකා හොන්ති, රාජයුත්තාපි තස්මිං සමයේ අධම්මිකා හොන්ති."

දැන් බහුවචනයෙන් මේකෙ තියෙන්නෙ. ලෝකයේ වෙසෙන රජවරු මහණෙනි යම් කලෙක " යස්මිං සමයේ "- යම් සමයක යම් කලෙක ලොව රජවරු "අධම්මිකා හොන්ති" - අධාර්මික වෙනවා නම් එතකොට බලන්න රජු කියන වචනය විභක්තිවල යෙදෙන කොට රාජා රාජා රාජාණෝ. රාජාණෝ කියන්නෙ රජවරු බහුවචනයෙන් තියෙන්නෙ. එහෙනම් එක රටක් ඉලක්ක කරලා නෙවෙයි මේ දේශනාව කියන්නෙ. භාග්‍යවතුන් වහන්සේ සමස්තය ඉලක්ක කරගෙනයි කියන්නෙ. යම් කලෙක රටවල්වල පාලකයෝ අධාර්මික වෙනවද

"තස්මිං සමයේ" ඒ කාලයට "රාජයුත්තාපි අධම්මිකා හොන්ති" - පාලකයන් ප්‍රධානීන්ට පහළින් ඊළඟට ඉන්න අය "රාජයුත්තාපි" රාජ සභාවේ ඉන්න අය අමාත්‍ය මණ්ඩලය ඒ අය අධාර්මික වෙනවා. ප්‍රධානීන් අධාර්මික වෙනකොට ප්‍රධානියාගේ ළඟ ඉන්න ඊට පහළ පුද්ගලයෝ ටික අධාර්මික පුද්ගලයෝ බවට පත්වෙනවා. ඒ ප්‍රධානියාට පහළින් ඉන්න පුද්ගලයන් ටික අධාර්මික වෙච්ච ගමන්

"රාජයුත්තේසු අධම්මිකේසු
බ්‍රාහ්මණ ගහපතිකාපි තස්මිං සමයේ
අධම්මිකා හොන්ති."

ඊට පස්සෙ ඊට පහළින් ඉන්න බ්‍රාහ්මණ ගෘහපතීන් අධාර්මික වෙනවා. රට රටවල්වල යම් යම් පූජ්‍ය පූජක පක්ෂයේ ඉන්නවනම් ඒ අය වේවා ව්‍යාපාරික මට්ටමේ ඉන්න අය ඉන්නවනම් ඒ අය වේවා ඔන්න මේ මේ අය අධාර්මික වෙන්න පටන්ගන්නවා.

යම් කලෙක පින්වතුනේ මේ තත්වය උත්සන්න වෙන කොට “බ්‍රාහ්මණගහපති කේසු අධම්මිකේසු හොන්ති.” යම් කාලයක බ්‍රාහ්මණ ගෘහපතීන් අධාර්මික වෙච්ච ගමන්ම “නෙගමජානපදාපි තස්මිං සමයේ අධම්මිකා හොන්ති.” ගම් නියම් ගම්වල මිනිස්සු අධාර්මික වෙන්න පටන් ගන්නවා. දැන් ඔන්න මානව සම්පත අධාර්මිකයි. ප්‍රධානියා අධාර්මිකයි. ප්‍රධානියාගේ ළඟ ඉන්න අය අධාර්මිකයි. ඊට පහළින් ඉන්න අය අධාර්මිකයි. ඊටත් පහළින් ඉන්න අය අධාර්මිකයි. ප්‍රධානියා රජු. ඊට පහළින් ඉන්නෙ අමාත්‍ය මණ්ඩලය. ඊට පහළින් ඉන්නෙ බ්‍රාහ්මණ ගෘහපතීන් . ඊට පහළින් ඉන්නෙ ගම් නියම් ගම් වැසියෝ. දැන් මානව සම්පත නැත්නම් මානව සංහතිය අධාර්මික වෙනවා. මේ බහුතරය ගැනයි පින්වතුනේ කියන්නෙ. දැන් මිනිස්සු සමස්ත සමාජයේ ඉන්න මිනිසුන්ගෙන් බහුතරයක් අධාර්මිකයි. සිතුවිලි අධාර්මිකයි. වචන අධාර්මිකයි.ක්‍රියා අධාර්මිකයි. මෙවන් වූ සිතුවිලි වචන ක්‍රියාවන් අධාර්මික වෙච්ච මිනිසුන් බහුතරයක් වෙසෙන යම් රටක් ලෝකයේ සමස්තය සැලකුවහම මේ තත්වය එන්න එන්න වැඩිවෙන කොට මිනිස්සුන්ගේ මේ අධාර්මිකකම ඔන්න පින්වතුනේ සොබාදහමට බලපානවා.

“නෙගමජානපදේසු අධම්මිකේසු විසමං චන්දිමසුරියා
පරිවත්තන්ති.”

පින්වතුනේ යම්කිසි දවසක යම්කිසි සමයක දැන් මානව සංහතිය අධාර්මික වෙච්ච ගමන්ම මේ ඔවුන්ගේ අධාර්මිකභාවය බලපානවා ඉර හඳ දෙකට. මානවයාගේ අධාර්මිකභාවය එක පාරටම බලපෑවේ ලෝකයේ ප්‍රබලම සොබා දහමේ සාධක දෙකකට. ඒ ඉරට හඳට. මොකක්ද බලපාලා සිදුවෙච්ච ක්‍රියාව. පින්වතුනේ

හරි වටිනව බලන්න තථාගත මගේ බුදු හාමුදුරුවන්ගේ ඉගැන්වීම. මොන තරම් නම් උන්වහන්සේ යථාර්ථවාදීද. උන්වහන්සේ මෙතන සඳහන් කරන්නෙ මේ ගම් නියම් ගම්වල මිනිසුන්ගේ අධාර්මික භාවය හේතු කරණකොට ගෙන "චන්දිමසුරියා විසමං පරිවත්තන්ති." ඉර හඳ දෙක විෂම විදිහට පරිවර්තනය වෙනවා. මිනිසුන්ගේ ක්‍රියා කලාපය ඉර හඳ විෂමව පරිවර්තනය වීමට බලපානවා. න්‍යෂ්ටික අවි අත්හදා බලනවා. රසායනික අවි අත්හදා බලනවා. කර්මාන්ත ශාලාවලින් අධික විෂ සහිත රසායනික ද්‍රව්‍ය පරිසරයට මුදා හරිනවා. මෙන්න මිනිසුන්ගේ ක්‍රියා. කතා කරන වචන හොඳ නහැ. ඒ වචනවල තියෙන්නෙ මහා සැර පරුෂ බව. ඒ බව මේ සමාජයට මුදා හරිනවා. ඒ සියල්ලම සිදුවෙන්නෙ සිත දූෂිත නිසා. සිත අධාර්මික නිසා. අධාර්මික සිතක් තියෙන පුද්ගලයෙකුට තමයි තවත් කෙනෙකු විනාශ කිරීම සඳහා ආයුධ නිෂ්පාදනය කරන්න හැකියාව තියෙන්නෙ. රසායනික අවි වේවා න්‍යෂ්ටික අවි වේවා තවත් පුද්ගලයන් සත්වයන් විනාශ කරවීම සඳහා උපක්‍රමශීලීව අධි බලැති අවි නිෂ්පාදනය කළ හැක්කේ සිත දූෂිත නිසායි. අධාර්මික සිතක් ඇති නිසායි. ධර්මයෙන් පෝෂණය කර ගත්ත සිතක් නැති නිසායි. සමාහිත සිතක් නැති නිසා. තථාගත ශ්‍රී සද්ධර්මය ලැබුණෙ නැති නිසා එවන් පුද්ගලයන්ගේ සිත අධාර්මිකයි. එවන් අධාර්මික පුද්ගලයන්ගේ වචන අධාර්මිකයි. එවන් අධාර්මික පුද්ගලයන්ගේ ක්‍රියා අධාර්මිකයි.

පින්වතුනේ ඒ තත්වය සමස්ත ලෝකය දෙස බැලුවහම එන්න එන්නම වැඩියි. ඒ නිසා මිනිසුන් විසින් තමන්ගේ පහසුව සඳහාය කියමින් සාදාගත්ත යම් යම් යන්ත්‍ර සූත්‍රවල භාවිතා කරන රසායනික ද්‍රව්‍ය නැවත මේ පරිසරයට මුදාහරින කොට ආයෙමත් මිනිසාට වෙන ක්‍රමයකින් එහි අනිටු ප්‍රතිඵලයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා බලන්ට අද වෙනකොට පින්වතුනේ මේ කාලය වෙනකොට මේ ජලය දූෂණය වෙන දේවල් ඒ වෙනුවෙන් පාවිච්චි

කරන දේවල් පරිසරය වායුගෝලය දූෂණය වෙන්න පාවිච්චි කරන දේවල් සමහර රට රටවල්වල ඒ අපද්‍රව්‍ය වශයෙන් බැහැර කරන ගොඩාක් දේවල් මේ වටිනා කියන රත්තරන් රටට ආනයනය කරන්නට මේ පිළිබඳ දැනුමක් නැති බොහෝ උදවිය උත්සාවත් වෙලා තියෙනවා කටයුතු කරගෙන යනවා.

අද මේ පරිසරයට පානීය පරිභෝජනීය ජලයට දැඩිව හානිය සිද්ධ කරන්නෙ ඔබ මම පාවිච්චි කරන ජංගම දුරකථනයේ බැටරිය පින්වතුනේ. ජංගම දුරකථනයේ බැටරිය පරිසරයට බැහැර කිරීම කරහම පසට ඒක එහි තියෙන විකිරණශීලී ද්‍රව්‍ය ඉතා වේගයෙන් ජලයට මුසුවෙලා ජලය දූෂණය වෙලා යනවා. බලන්න පින්වතුනේ මොන හේතුවක් නිසාවෙන් හෝ එක්කෙනෙක් ළඟ ජංගම දුරකථන කීයක් තියෙනවද? ඒ වගේම පින්වතුනේ පරිගණක ආදී කරගත්ත තවත් බොහෝ දේවල්වල මේ වගේ එළියට දාන බැහැරට දාන රසායනික අපද්‍රව්‍ය මොනතරම් තියෙනවද. පුදුම දේ කියලා කියන්නෙ මේ රටේ තිබෙන ලිහිල් නීතිරීති හේතුකරණ කොටගෙන මම දැක්කා පින්වතුනේ දැන් දැන් ඉතා සීඝ්‍රයෙන් සමහර රටවල්වල බැහැර කරන කුණු කන්දල් නැව් ගණන් මේ රටට ගෙනල්ලා තොග ගණන්වලට අඩු මුදලට විකුණනවා. අපේ බොහෝ අය පෝලිම්වල ගිහිල්ලා ඒවා ගන්නවා. යකඩ කැලි ඇඳ පුටුවේ ඉඳලාම මෙට්ටෙ කොට්ටෙ ඉඳලාම පිටරටවල්වල මිනිස්සු පාවිච්චි කරලා බැහැර කරපුවා සපත්තුවේ ඉඳලා ඇඳුමෙ කැඩුමෙ ඉඳලාම ඔය අතරෙ පින්වතුනේ මේ ඉලෙක්ට්‍රෝනික ද්‍රව්‍ය බැහැර කරපුවා යම් යම් දෝෂ නිසා බැහැර කරපුවා කුණු කොල්ලෙට මෙහෙ ගෙනල්ලා යම් මුදලකට විකුණනවා. අපේ අය පෝලිම්වල ඉඳන් මේවා ගන්නවා. ගන්න බැරි කොටස මේ රටේ ඉතුරු වෙනවා කොහේ හරි තැනක ගිහින් ගොඩ ගහනවා. ගඟකට, ඇලකට, දොළකට, මුහුදකට මේවා ගිහිල්ලා බැහැර කරනවා. බලන්න ඒ රටවල්වල මිනිස්සු මේවා බැහැර කරගන්න බැරිව ඉන්නවා. අපේ අය සල්ලි දීලා ඒවා අරගන්නවා.

ගෙනත් මේ වටිනා පුණ්‍ය භූමිය තුළ පිරිසිදු ජලය දූෂණය කරලා දාන්ට පිරිසිදු වාතාශ්‍රය දූෂණය කරලා දාන්ට පාවිච්චි කරන්නෙ පාලකයන්ගේ තිබෙන අධාර්මිකභාවය නිසා නෙවෙයිද? මේ තථාගත ශ්‍රී සද්ධර්මය උගන්වන යථාර්ථය තේරුම් ගත්තෙ නැති නිසා නෙවෙයිද? ඒ ඒ රටවල්වල කුණු කන්දල් මේ රටට ගෙනල්ලා බලන්න පින්වතුනේ සමහර වෙලාවන්වලදී ඔබ විසින් ඔබේ හිස පිරිසිදු කරගන්න කොණ්ඩය පිරිසිදු කරගන්න පිටරටවල්වලින් ආනයනය කරලා ගාන විවිධ ජෙල් වර්ග ෂැම්පු වර්ග ඒවා බහා තිබෙන පොලිතින් කවර ටින් බෙලෙක්ක ප්ලාස්ටික් බඳුන් ඒ ඒ රටවලින් ආනයනය කරලා මෙහි පාවිච්චි කරලා අපේ පරිසරයට දානවා. කොණ්ඩය සෝදන කොට ඒ සේරම රසායනික ද්‍රව්‍ය අපේ රටේ ජලයට මිශ්‍ර වෙනවා නේද? බලන්න මේ පොළොවට නේද මේ දාගන්න තරමක් විෂ රසායනික ද්‍රව්‍ය දාගන්නෙ කියලා.

මේ රත්තරන් පොළොවේ ඕනෑම තැනක වතුර ටිකක් බොන්න පුළුවන්කම අපට තිබුණා. දැන් ඒ තත්වය නැතිවෙලා. සංචාරකයින් සඳහා පින්වතුනේ ආරක්ෂිත ආකාරයට සීල් තබා ඒ නිෂ්පාදනය කරන ජල බෝතල් දැන් අපි හැමෝටම පානය කරන්න සිද්ධ වෙන මට්ටමක් දැනටම උදාපත් වෙලා. රටේ ඕනෑම තැනක ගිහින් ඕනෑම ළිඳකින් වතුර අරන් බොන්න පුළුවන්කම තිබිච්ච අපේ රටේ මිනිස්සුන්ට මේ මොකද වෙන්නෙ? ඔන්න පින්වතුනේ ඇඟට නොදැනීම සිතට නොදැනීම පෙනෙනවාද අපේ ජලය දූෂණය වෙච්ච තරම. අපේම ක්‍රියාකාරකම් තියෙන්නෙ. පිටරටවල් වල ඉඳලා එන මිනිස්සුන්ට සීමා වැටකඩොලු නැහැ අරගෙන එන්න පුළුවන් දේවල්වලට. ඔවුන් විනෝදවෙලා යන්න මේ රටට එනකොට විවිධ රසායනික ද්‍රව්‍ය ඇඟේ ගාන ඒවා ඔය මම දැන් කියපු ෂැම්පු වර්ග ඇතුළු කරගත්ත බොහෝ දේවල් මෙරටට අරගෙන ඇවිල්ලා මෙහෙ ඉන්නතාක් කාලය පුරාවටම ඒ හෝටල්වල නවාතැන්වල ඒවා ඉන්න ගමන් පාවිච්චි කරලා ඒ

සියල්ල මෙහි බැහැර කරලා යනවා. ඒ ඒ රටවල්වල තියෙන සියලුම විෂ සහිත රසායනික ද්‍රව්‍ය මෙරටට ගෙනල්ලා දානවා නිකම්ම. මේවට හේතු සාධක පාලකයන්ගේ දුර්වලතාවයන් නෙවෙයිද කියලා මේ අධම්මික සූත්‍රයට අනුව ඉතාමත්ම පැහැදිලි වෙනවා.

ඒනිසා එකක් නොවෙයි හේතු රාශියක් බලපානවා පින්වතුනේ මේ සොබාදහම පරිසර සමතුලිත භාවයට සොබා දහම පාවිච්චි කරන උපක්‍රමය නාය යෑම වේවා ගංවතුර වේවා එහෙම නැත්නම් වසංගත රෝග වේවා එහෙම නැත්නම් අකුණු සැර වේවා මෙන්න මේ ආදී දේවල්වලට හේතු සාධක එකට වඩා බලපානවා. මිනිසුන්ගේ ක්‍රියාකාරකම් තමයි බහුතරයක් එහි තිබෙන්නෙ. ඒ නිසා සමස්ත මිනිස් ප්‍රජාව අධාර්මික වෙච්ච ගමන්ම ඉස්සෙල්ලාම සිදුවුණේ පින්වතුනේ ඉර හඳ දෙක විෂම විදිහට පරිවර්තනය වුණා. ඉරෙන් නිකුත් කරන ආලෝක ධාරාවන් සූර්යය කිරණ මිනිසාට අහිතකර විදිහට බලපාන්න පටන් ගත්තා. මේ න්‍යෂ්ටික අවි අත්හදා බැලීම් ඇතුළු කර ගත්ත තව බෙහෝ රසායනික අපද්‍රව්‍ය හේතු කරණකොට ගෙන ඕසෝන් ස්තරය පළුදුවුණා. අන්න මිහිමතට සූර්යයාගේ නරක නපුරු පාර ජම්බුල කිරණ, එක්ස්කිරණ එන එක වළක්වාලීමට තිබිච්ච ස්තරය පළුදු වෙනවා. පළුදුවුණා. ඒ කිරණ මිහිමතට පතිත වෙනකොට චර්ම රෝග ඇතුළු කර ගත්ත බොහෝ රෝග මිනිසුන්ට වැළදෙන්න පටන් ගත්තා. ඉරෙන් නිකුත් කරන කිරණ එතකොට විෂ සහිතයි. හඳෙන් නිකුත් කරන කිරණ අපි හඳ ගැන කතාකරන කොට කියන්නේ සොමි ගුණ කියලා. සෞම්‍ය ගුණයි හඳෙන් දෙන්නෙ කියලා ඒවත් පින්වතුනේ ටික ටික දූෂණය වෙලා. විෂම විදිහට ඉර හඳ දෙක පරිවර්තනය වුණා.

දැන් අපි කල්පනා කළොත් ඉතාම පැහැදිලියි අධම්මික සුත්‍රය මේ කියන කොට ලියාගන්න පින්වතුන් ඉන්නවා අපි දන්නවා. ඔබ ලියා ගන්න අයට මම කියන එක හොදින් බලන්න පුළුවන් එකකට එකක් එකක් පස්සෙ සිදුවන නියම පටිච්ච

සමුප්පන්න ස්වරූපය ඔබට බලාගන්න පුළුවන්. එක තැනක සිදුවන වැරැද්ද තව තැනකට බලපානවා. ඒ වැරැද්ද තව තැනකට බලපානවා. ඒ වැරැද්ද තවත් තැනකට බලපානවා එහෙම එහෙම එහෙමයි දිගට යන්නෙ. දැන් ඔබෙන් ඇහුවොත් මම ඇයි ඉර හඳ දෙක විෂම වුණේ කියලා ඔබට දෙන්න උත්තරයක් තියෙනවා ගම් නියම්ගම්වල මිනිස්සු අධාර්මික වෙච්ච නිසාය කියලා. එතකොට මම අහනවා ගම් නියම්ගම්වල මිනිස්සු අධාර්මික වුණේ ඇයි කියලා. එතකොට ඔබ කියනවා බ්‍රාහ්මණ ගෘහපතීන් අධාර්මික වෙච්ච නිසාය කියලා. මම අහනවා ඇයි ඔවුන් අධාර්මික වුණේ කියලා. එතකොට ඔබ කියනවා " රාජයුත්තාපි අධම්මිකා " අමාත්‍යවරු අධාර්මික වෙච්ච නිසාය කියලා. රාජපුරුෂයන් අධාර්මික වෙච්ච නිසාය කියලා. එතකොට මම අහනවා රාජපුරුෂයන් නැත්නම් අමාත්‍යවරු අධාර්මික වුණේ ඇයි කියලා. එතකොට ඔබට දෙන්න උත්තරයක් තියෙනවා ඔබ කියනවා රජු අධාර්මික නිසාය කියලා. ප්‍රධානියා අධාර්මික නිසාය එහෙම වුණේ කියලා. තාම අවසන් නැහැ පටන් ගත්තා විතරමයි.

පින්වතුනේ, යම් කලෙක ඉර හඳ දෙක විෂම වෙනවාද " "විෂමං චන්දිමසුරියේසු පරිවත්තන්තේසු විසමං නක්ඛත්තානි තාරකරූපානි පරිවත්තන්ති "

ඉර හඳ දෙක විෂම වෙච්ච ගමන් ඒ විෂමවීම බලපානවා ඊළඟට නැකැත් තරුවලට " නක්ඛන්නාති තාරකරූපානි විෂමං පරිවත්තන්තේසු " නැකැත් තරු විෂම විදිහට පරිවර්තනය වෙනවා පින්වතුනේ. නැකැත් තරු විෂම වෙච්ච ගමන් ඊට පස්සෙ මොකද වෙන්නෙ? " විෂමං නක්ඛත්තේසු තාරකරූපේසු පරිවත්තන්තේසු " විෂමං රත්තින්දිවා පරිවත්තන්තේසු "

රෑ දවල් වෙන එක විෂම විදිහට පරිවර්තනය වෙනවා. නැකැත් තරු විෂම වුණාම රෑ දවල් වෙන එක විෂම වෙනවා. සමහර කාලවලට රෑ වැඩියි. සමහර කාලවලට දවල් වැඩියි. සමහර කාල

තියෙනවා රෑවෙලා ඒ වුණාට තාම පරිසරය දෙස බැලුවහම ඉර එළිය තියෙනවා. විෂම විදිහට පරිවර්තනය වෙලා. දැන් ඕක ආ පස්සට ඕනෙ නම් ආයෙත් සිතමු. ඇයි රෑ දවල් වෙන එක විෂම වුණේ? ඔබට උත්තරයක් තියෙනවා නැකැත් තරු විෂම වෙච්ච නිසාය කියලා. එතකොට මම අහනවා ඇයි නැකැත් තරු විෂම වුණේ? ඉර හඳ දෙක විෂම වෙච්ච නිසා. එතකොට මම අහනවා ඇයි ඉර හඳ දෙක විෂම වුණේ? ගම් නියම්ගම්වල මිනිස්සු අධාර්මික වෙච්ච නිසා. ඔන්න ආයෙත් කෙලවරට යනකොට ඉන්නවා ප්‍රධානියා. ඉවර නැහැ

පින්වතුනේ යම්කිසි කාලෙක රෑ දවල් වෙන එක විෂම විදිහට පරිවර්තනය වෙනවද

"විසමං රත්තින්දිවේසු පරිවත්තන්තේසු
විසමං මාසද්ධමාසා පරිවත්තන්ති".

පින්වතුනේ රෑ දවල් වෙන එක නිසානෙ දින කියලා එකක් අපට එන්නෙ. දැන් දින කියන ඒවා විෂම වුණ ගමන් ඒ පාර මොකද වෙන්නෙ "මාසද්ධමාසා විසමං පරිවත්තන්ති." මාස අර්ධ මාස දින සති කියන ඒවා ඔක්කොම විකෘති වෙනවා. විෂම විදිහට පරිවර්තනය වෙනවා. දින සති මාස කියන ඒවා ඒ යන චක්‍රය වෙනස් වෙනවා. දින සති මාස විෂම විදිහට පරිවර්තනය වුණහම ඊට පස්සෙ මොකද වෙන්නෙ? මාස අර්ධ මාස විෂම විදිහට පරිවර්තනය වුණහම පින්වතුනේ

"විසමං මාසද්ධමාසේසු පරිවත්තන්තේසු
විසමං උතුසංවච්ඡරා පරිවත්තන්ති."

සෘතු වෙනස්වෙනවා ඒ පාර. සෘතු වෙනස් වෙනවා. හේමන්ත ගිම්හාන වස්සාන කියලා අපි ඔහොම කියන්නෙ එක එක සෘතු තියෙන්නෙ. දැන් ඒ සෘතු අල්ලලානෙ යල කන්නෙ මහ කන්නෙ එහෙම වගා කිරීම් ආදී දේවල් කරන්නේ. දැන් දින, සති, මාස කියන ඒවා විෂම විදිහට පරිවර්තනය වෙච්ච ගමන්ම ඔන්න පින්වතුනේ

ඊට පස්සෙ සෘතු වෙනස් වෙනවා. සෘතු විෂම වෙනවාය කියලා කියන්නෙ. සම නැහැ විෂම වෙනවා. සෘතු විෂම විදිහට පරිවර්තනය වෙනවා. සෘතු විෂම වුණාට පස්සෙ "විසමං උතුසංවච්ඡරේසු පරිවත්තන්තේසු විසමං වාතා වායන්ති විසමා අපඤ්ජසා." දැන් හොඳින් ඇහුම්කන් දීගෙන සිටියා නම් එතන තියෙනවා හැමතැනම කියාගෙන ආපුදේට වඩා අතිරේක වචනයක්. දැන් සෘතුව විෂම වුණහම ඒ පාර වායුගෝලයටයි ඒක බලපාලා තියෙන්නෙ. අර බලන්න "විසමං උතුසංවච්ඡරේසු පරිවත්තන්තේසු." සෘතුව විෂම විදිහට පරිවර්තනය වුණහම "විසමං වාතා වායන්ති." වාතය විෂම වෙලා හමනවා. එතනම කියනවා "විසමා අපඤ්ජසා" කියලා එහෙම අතිරේක වචනයක් අනික් එක තැනකවත් තිබුණෙ නැහැ. වායු ගෝලය විෂම විදිහට හමනවා. "විසමා අපඤ්ජසා." අපඤ්ජසා කිව්වෙ වායුගෝලය විෂම වුණහම වායු වැඩියෙන් හෝ අඩුවෙන් හමන්න පුළුවන් කියලා තමයි කියන්නෙ. දැන් ඔය දෙකම වෙනවා. වායුගෝලය විෂමයි. ඒ නිසා හිටිය ගමන් සමහර පළාත්වලට "විසමං අපඤ්ජසා." දැඩි සුළං හමාගෙන යනවා. රොනාඩෝ කියලා කියනවා කැත්රිනා කියලා කියනවා. එක එක නම්වලින් ඔය කියන්නෙ. අන්න වායුගෝලය විෂම වෙලා. ඒ විෂම වායු ගෝලය "අපඤ්ජසා" කියන වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ හඳුන්වපු දේ. වැඩි හෝ අඩු සුළං එන්න පුළුවන්. වැඩි සුළං ආවත් කොහොමහරි යම්තම් දරාගෙන ඉඳලා බේරෙන්න නම් පුළුවන් වෙයි. සුළං අඩුවෙලා ගියොත් නැතිවෙලා ගියොත් එහෙම හුස්ම හිරවෙලා මැරිලා යන්නත් පුළුවන්. එහෙම වෙන අවස්ථාවලුත් තියෙනවනෙ. ඒ තත්වයන් ඉදිරියේදී තව වැඩි වෙන්නත් පුළුවනි. කොහොම හරි කමක් නැහැ දැන් ඔන්න සෘතුව විෂම වෙච්ච ගමන්ම වායු ගෝලය විෂම වුණා. විෂම විදිහට වාතය හමන්න පටන්ගත්තා. මඳකට ආපස්සට යමු. ඇහුවොත් ඇයි වායුගෝලය විෂම විදිහට පරිවර්තනය වුණේ? සෘතු විෂම වෙච්ච නිසා. ඇයි සෘතු විෂම වුණේ

දින සති මාස වෙනස් වෙච්ච නිසා. ඇයි දින සති මාස වෙනස් වුණේ? රෑ දවල් වෙන එක විෂම වෙච්ච නිසා. ඇයි රෑ දවල් වෙන එක විෂම වුණේ?නැකත් තරු විෂම වෙච්ච නිසා. ඇයි නැකැත් තරු විෂම වුණේ? ඉර හඳ දෙක විෂම වෙච්ච නිසා. ඇයි ඉර හඳ දෙක විෂම වුණේ? ගම් නියම් ගම්වල මිනිස්සු අධාර්මික වෙච්ච නිසා. ඇයි ඒ මිනිස්සු අධාර්මික වුණේ? බ්‍රාහ්මණ ගෘහපතීන් අධාර්මික වෙච්ච නිසා. ඇයි ඔවුන් අධාර්මික වුණේ? "රාජයුත්තාපි අධම්මිකා." අමාත්‍යවරු අධාර්මික වෙච්ච නිසා. ඇයි ඔවුන් අධාර්මික වුණේ? රාජාණෝ අධම්මිකා. වගකිව යුත්තෝ අධාර්මික වෙච්ච නිසා. රජවරු අධාර්මික වෙච්ච නිසා. ප්‍රධානියෝ අධාර්මික වෙච්ච නිසා.

බලන්න එකකට එකක් පස්සේ එක හේතුවක් නිසා ඵලයක් ද ඒ ඵලය හේතුවක් වී තව ඵලයක් ද ඒ ඵලය හේතුවක් වී තව ඵලයක් ද ආදී විදිහට වරෙක හේතුව ඵලය ද තව වරෙක එම ඵලය හේතුව වී තව ඵලයක් ද වශයෙන් හේතු ඵල වශයෙන් ඔන්න පින්වතුනේ පරිවර්තනය වෙමින් එනවා. දැන් වායුගෝලය විෂම විදිහට පරිවර්තනය වෙලා නැත්නම් විෂම විදිහට හමන්න පටන් ගත්තා වැඩි හෝ අඩු වශයෙන්. එහි ප්‍රතිඵලයක් වශයෙන් " විෂමං වාතේසු වායන්තේසු විසමේසු අපඤ්ඤජසේසු දේවතා පරිකුපිතා භවන්ති " අපි සිතන් ඉන්නවා වායුගෝලයේ ඉන්නෙ වායු ප්‍රයෝජනයට ගන්නෙ අපි ටික විතරයි කියලා. මිනිස්සුයි සත්තුයි විතරයි කියලා

මෙන්න පින්වතුනේ භාග්‍යවතුන් වහන්සේ පෙන්වලා දෙනවා මේ වායුගෝලය තුළ තවත් පිරිසක් ඉන්නවා. දේවතා දෙවිවරු. මිනිසුන් විසින් මිනිසුන්ගේ නොහොබිනාකම් හේතු කරණ කොට ගෙන වායුගෝලය දූෂණය කරගත්ත ගමන් කිපීමට පත්වෙනවා දෙවියෝ. "දේවතා පරිකුපිතා භවන්ති." දෙවියෝ ප්‍රකෝප වෙනවා කියලා කිව්වා වායුගෝලය දූෂිත හින්දා. දෙවියන් ප්‍රකෝප වෙනවා. එතකොට මොකද වෙන්නෙ?

"දේවතාසු පරිකුපිතාසු දේවෝ න
සම්මාධාරං අනුප්පවෙච්ඡති"

දේව කියන වචනය තව තැනක යෙදෙනවා වර්ෂාවට. මෙන්න බලන්න දෙවියන් ප්‍රකෝප වෙච්ච ගමන් එහි ප්‍රතිඵලයක් වශයෙන් "දේවෝ න සම්මාධාරං අනුප්පවෙච්ඡති." වර්ෂාව වෙලාවට වහින්නෙ නැහැ. වර්ෂාව සමව වහින්නෙ නැහැ. වර්ෂාව විෂම වෙලා වහිනවා. ඕන තැනට වහින්නෙ නැහැ. ඕනෙ නැති තැනට වහිනවා. විෂම වෙනවා කියලා කියන්නෙ. මේ දෙවියන්ගේ ප්‍රකෝපවීම පදනම් කරගෙන සිද්ධ වෙන දේ කියලයි මෙහි සඳහන් වෙන්නෙ. දැන් මේකෙ ප්‍රතිඵලය මොකක්ද? වර්ෂාව වෙලාවට වහින්නෙ නැති වුණහම නැත්නම් වර්ෂාව සමව වහින්නෙ නැති වුණහම ඊට පස්සෙ වෙන්නෙ "දේවේන සම්මා ධාරං අනුප්පවෙච්ඡන්තේ විසමපාකිනි සස්සානි භවන්ති." ඔන්න බෝග ටික විෂම වෙනවා ඒ පාර. ඇයි වෙලාවට වහින්නෙ නැති කොට ඒවාට වෙන්න තියෙන හානිය වළක්වා ගන්න කෘතිම රසායනික දේවල් ගහන්න වෙනවා. වගාවට කුඹුරට එළවළු ටිකට පලතුරු ටිකට. එතකොට විෂ සහිත දේවල් තමයි තියෙන්නෙ. එතකොට "සස්සානි විසම, විසමානිපාකිනියෝ." ශස්‍යයෝ ටික ඔක්කෝම පින්වතුනේ විෂම විදිහට තමයි පැහෙන්නෙ. බෝග සම්පත්තිය එළවළු, පලතුරු, කුඹුරු විෂම වෙලා පැහෙනවා. දැන් ඉතින් මොකද වෙන්නෙ? විෂම ශස්‍ය තමයි අනුභවයට තියෙන්නෙ. ඔන්න පටන් ගන්නවා.

"විසමපාකිනි භික්ඛවේ සස්සානි මනුස්සා පරිභුඤ්ජන්තා"

විෂම වෙච්ච ශස්‍ය එළවළු, පලතුරු, කුඹුරු නැත්නම් හාල් ටික "පරිභොඤ්ජන්ති මනුස්සා" අනුභව කරන මිනිස්සුන්ට මොකද වෙන්නෙ? "අප්පයුකා ච හොන්ති." එන්න එන්නම ආයුෂ අඩු බවට පත්වෙනවා. "දුබ්බණ්ණා ච හොන්ති." එන්න එන්නම දුර්වර්ණ පුද්ගලයෝ බවට පත්වෙනවා. "දුබ්බලා ච හොන්ති." එන්න එන්නම

ශක්තිය නැති පුද්ගලයෝ බවට පත්වෙනවා. “බහුආබාධ ච හොන්ති” එන්න එන්නම බොහෝ ආබාධ ඇති පුද්ගලයන් බවට පත්වෙනවා. බලන්න පින්වතුනේ පටන් ගත්තෙ රජුගෙ අධාර්මිකභාවය කියන තැනින්. අවසානයේ බලන්න ඒ අධාර්මිකභාවය සොබාදහමටත් බලපාලා අවසානයේ ආයෙමත් ඒක මිනිස්සුන්ටම නරකම විදිහට බලපෑවා. එන්න එන්නම මිනිසුන්ගේ ආයුෂ අඩුවෙන්න එන්න එන්නම මිනිස්සු අවලස්සන වෙන්න එන්න එන්නම මිනිසුන්ගේ හයිය නැති දුර්වල පුද්ගලයෝ වෙන්න එන්න එන්නම මිනිස්සුන්ට ලෙඩ රෝග වැඩිවෙන්න හේතු සාධකය බවට මේ සියල්ල පරිවර්තනය වුණා. මෙන්න මේ නිසා තමයි අපට ප්‍රාර්ථනා කරමින් කටයුතු කරන්න වෙලා තියෙන්නෙ.

“දේවෝ වස්සතු කාලේන” - වර්ෂාව වෙලාවට වහීවා “ සස්ස සම්පත්ති හෝතුච ” - ශස්‍යයෝ මනාව පැහේවා. “ පීතෝ භවතු ලෝකෝච ” - ලෝකයාගේ සිත් සතුටු වේවා. “ රාජා භවතු ධම්මිකෝ ” මේ සියල්ල වෙන්න නම් සිදුවෙන්න ඕනෑ ප්‍රබල පරිවර්තනය මොකක්ද? රාජා භවතු ධම්මිකෝ ” - ලොව රජවරු ලොව පාලකයෝ ධාර්මික වේවා කියන පැතුම සිද්ධ කරන එක. මෙය සිද්ධ කරලා ලොව ධාර්මික රජවරු පහළ කර ගැනීම පිණිස සිතුවිලිවලින් දායක වීමට උදේ සවස නිතර ප්‍රාර්ථනාවක් වශයෙන් සිදුකරන ලෙස සිහිපත් කරමින් අධාර්මික සූත්‍රය දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ එතනම ධාර්මික සූත්‍රයත් දේශනා කරලා තියෙනවා. ඒ කියන්නෙ මේ කියන දේ වෙනස් වුණොත් එහෙම ඊට පස්සෙ සෞභාග්‍ය උදාවෙන හැටි දක්වලා තියෙනවා. එය ඉදිරි දිනෙක පැහැදිලි කරලා දෙන්න බලාපොරොත්තු වෙමින් අද ධර්මානුශාසනාව නිමාකරන්නට මත්තෙන් පුණ්‍යානුමෝදනාව .

……

……

ධර්ම ශ්‍රාවක පින්වත්නි ඔබටත් ඔබ පවුලේ සියලු දෙනාටත්

දෙවියන් සහිත ලෝක සත්වයාත් උතුම් නිර්වාණ දහමින් සදා සැනසෙන්නට මේ පින පාරමී ධර්මයක්ම වේවායි සාධු කියා ප්‍රාර්ථනා කර ගනිමු.

ආකාසට්ඨාච භුම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු ලෝක සාසනං
චිරං රක්ඛන්තු දේසනං
චිරං රක්ඛන්තු මං පරන්ති.

# ධර්ම දේශනා - 3
## (2017.06.14 දින ධර්ම දේශනාව)

සමන්තා චක්ක වාලේසු
අත්‍රාගච්ඡන්තු දේවතා
සද්ධම්මං මුනිරාජස්ස
සුනන්තු සග්ග මොක්ඛදං

ධම්මස් සවන කාලෝ අයං භදන්තා
ධම්මස් සවන කාලෝ අයං භදන්තා
ධම්මස් සවන කාලෝ අයං භදන්තා

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස ///

"ගුන්නං චේ තරමානානං
උජුං ගච්ඡති පුංගවෝ,
සබ්බා තා උජු ගච්ඡන්ති
නෙත්තේ උජුගතේ සතිං තී තී."

ධර්මශ්‍රවණාභිලාෂී සැදැහැති වාසනාවන්ත කාරුණික පින්වත්නි,

දින දින දියුණු කරගන්න ධර්මඥාණය දැන් ඔබට තිබෙන්නෙ ප්‍රායෝගික ජීවිතය තුළ අත්දැකීමක් බවට පත්කරගැනීම. තථාගත ශ්‍රී සද්ධර්මය කියන්නෙ අනුභූතියක්. ඒ කියන්නෙ අත්දැකීමක් කරගත හැකි දෙයක්. ලොව්තුරු මගේ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම තුළ රහස් ඇත්තෙ නැහැ පින්වතුනේ. කොළේ වහලා ගහලා දාපු කිසිවක් මේ ඉගැන්වීම තුළ නැහැ. ඒ නිසා විවෘත වෙච්ච තරමට බබලන ලෝකයේ එකම දහම තථාගත ශ්‍රී සද්ධර්මය.

"තථාගතප්පවේදිතෝ ධම්මෝ විවටෝ
විරෝචති නෝ පටිච්ඡන්නෝ."

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය විවෘත වෙච්ච තරමටයි බබලන්නෙ. "නෝ පටිච්ඡානි" වහලා තිබුණහම එහෙම වෙන්නෙ නැහැ. මේ ලෝකයේ වහලා තිබුණහම හොඳ ඒවත් විවෘත කරහම හොඳ ඒවත් කීපයක් තිබෙනවා. ඒ පිළිබඳව පින්වතුන්ට ප්‍රකාශ කරන්නට මත්තෙන් අද ධර්ම දක්ෂිණාවේ දායකත්වය දරමින් ධර්ම දානමය ආනිශංස සඳහා හිමිකම් කියනු ලබන්නේ කටුනායක UTB ආයතනයේ සේවය කරන සඳමාලි, ප්‍රදීපිකා, මානෙල්, ඉන්දු, චන්දිමා, මල්කි, මේනකා යන පින්වත් පිරිස. දායකත්වය දරණ පින්වතුන්ටත් ශ්‍රාවක පිනැති ඔබ සැමටම උතුම් ධර්මාවබෝධය ලබන්ට ඒකාන්ත වශයෙන්ම ධර්ම දක්ෂිණාව උපනිශ්‍රය වේවා කියන පැතුමෙන් අපි දහම් ශ්‍රවණය කරමු.

පින්වතුනේ මේ ලෝකයේ ඉර සහ හඳ කියලා කියන්නෙ විවෘත වෙච්ච තරමටම බබලන වස්තු දෙකක්. ඉර වැහිලා තියෙනතාක් බබලන්නෙ නැහැ. හඳ වැහිලා තියෙනතාක් බබලන්නෙ නැහැ. ඒ වගේමයි තථාගත දහම වැහිලා තියෙන තාක් බබලන්නෙ නැහැ. පින්වතුනේ ඒ නිසා ඉර විවෘත වෙන්ට ඕන. හඳ විවෘත වෙන්ට ඕන. තථාගත දහම විවෘත වෙන්ට ඕන. විවෘත වෙන්න වෙන්න දීප්තිය, කාන්තිය, ආලෝකය ගෙනල්ලා දෙන වස්තු තුනක් තමයි මම ඔය සඳහන් කරන්න යෙදුණේ. බමුණන්ගේ වේද ග්‍රන්ථ වහලා තියෙන තරමට බබලනවා. දේවවාදී ආගමික ඇදහිලි වහලා තියෙන තරමටම බබලනවා. කාන්තා ශරීරය වහලා තියෙන තරමටම බබලනවා. නිකමට සිතන්න මේවා විවෘත වුණොත් කොහොමද කියලා. වේද ග්‍රන්ථ ටික විවෘත වුණොත් කිව්වේ ඒවා පාවිච්චි කරන්ට සංවාද විවාද හදාගන්නට බලන්න මොකද වෙන්නෙ කියලා. බලන්න එහි තියෙන පුහු ලාමකබව මහා බ්‍රහ්මයා මුල්කරගෙන මේ සමස්ත සමාජය අසාධාරණ විදිහට බෙදපු හැටි එළිවෙනවා පින්වතුනේ. බමුණන්ටම ඉහළ වැජඹීම සඳහා තමන්ගේම මල්ල තරකර ගැනීම පිණිසම හදපු නිර්මාණයක්

කියන බව එළියට එනවා විවෘත වුණොත් එහෙම. වහලා තියාගන්න තාක්කල් හොඳයි පින්වතුනේ වේද ග්‍රන්ථ. සියලුම දේවවාදී ආගම් ද එහෙමම තමයි. වහලා තියෙන තාක් හොඳයි විවෘත කළොත් විනාශයි. විවෘත වුණොත් අහන්න ප්‍රශ්න ගොඩයි. ලෝකය දෙවියන් වහන්සේ මැව්වා නම්, ලෝකය දෙවියන් වහන්සේ මැව්වා නම් දෙවියන් වහන්සේ කොහෙ ඉඳන්ද ලෝකය මැව්වේ. දෙවියන් වහන්සේ ඉන්න එකට මොකද කියන්නෙ? ප්‍රශ්න ගොඩක් අහන්න තියෙනවා. ඒ නිසා වහල තියෙන තරමට හොඳයි දේව වාදී ආගම්වල ග්‍රන්ථ ටික. ඉගැන්වීම් ටික. කොළේ වහලා කතා කරන තරමට හොඳයි. විවෘත වුණොත් පුස්සක් කියන බව පෙනෙනවා. විවෘත වුණොත් වුවමනාවෙන්ම තමන් විසින් හදන ලද පක්ෂග්‍රාහී ඉගැන්වීමක් බව පෙනෙනවා. අසාධාරණ ඉගැන්වීමක් බව පෙනෙනවා. ඒ නිසා වහලා තියෙන තරමට තමයි දේවවාදී ආගම් සහ බමුණු ඉගැන්වීම් ටික බබලන්නෙ. කාන්තා ශරීරයත් එහෙමයි. වහලා තියෙන තරමට හොඳයි. විවෘත වුණොත් විනාශයි නේද? කාන්තා සිරුර වහලා තියෙන තාක් හොඳයි බබලනවා ප්‍රශ්නයක් නැහැ.විවෘත කළොත් විවෘත වුණොත් විනාශයි. ඒ ශරීර හිමි කෙනත් විනාශයි. දකින කෙනත් විනාශයි කෙලෙස් ඉස්මතුවන හින්දා. දැන් පැහැදිලියි ලෝකයේ වහලා තියෙන තරමට පැවැත්ම තියෙන්නෙ කොයි දේවල්වලටද කියලා. ලෝකයේ විවෘත වෙච්ච තරමට බබලන්නෙ කොයි දේවල්ද කියලා. චන්ද්‍ර මණ්ඩලය සූර්යය මණ්ඩලය තථාගත ධර්මය විවෘත වෙච්ච තරමට බබලනවා. ඒ නිසා මේ ගතවේගෙන යන කාලය තුළ ඉතා පැහැදිලිව පෙනෙනවා තථාගත මගේ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම ක්‍රමයෙන් ක්‍රමයෙන් ඉතාමත්ම වේගයෙන් විවෘත වෙන කාලයක් බව.

පින්වතුනේ,

භාග්‍යවතුන් වහන්සේගේ ඉගැන්වීම්වලින් සනාථවන දේ ලෝකයෙන් පරිසරයෙන් එන්න එන්නම සාධක හමුවෙනවා. භාග්‍යවතුන් වහන්සේ උගන්වපු කාරණාවන් ඇස් ඉදිරිපිට සිද්ධ වෙනවා. ඒ වගේම සමහර අතීත ප්‍රවෘත්තිවලට අදාළ කරන යම් යම්

පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂයන් ඉස්මතු වෙනවා. ඒවා ඉස්මතු වෙනකොට මෙතෙක් දරණ ලද ඉතිහාසය සම්පූර්ණයෙන්ම වෙනස් වන තත්වයක් ගොඩ නැගීගෙන යනවා. සමහර නව සොයාගැනීම් එන කොට විද්‍යාත්මක පර්යේෂණ නෙවෙයි මම කිව්වේ. කැණීම් කරලා සොයාගන්න සමහර දේවල් එක්ක මෙතෙක් දරණ ඉතිහාසය වෙනස් වෙච්ච ආකාරය පසුගිය ඉතා කෙටි කාලයක් ඇතුළත ලංකාවේ පවා සොයා ගත්ත පුරාවිද්‍යාත්මක බඩු බාහිර ආදී දේවල් මම මේ කියන කාරණාව සනාථ කරන්ට යෙදුණා. ඒ නිසා මේ හැම පැත්තකින්ම ගොඩනැගීගෙන ගොඩනැගීගෙන එන්නෙ භාග්‍යවතුන් වන්සේගේ ධර්මය සනාථ කරන කාලය. උන්වහන්සේගේ ඉගැන්වීම ඵල දරණ කාලය නැවත වාරයක්. ඒ ඉගැන්වීමට සැබෑ තැන ලැබෙන්ට එන කාලයක්. ඒ නිසා සමාජය තුළ විවිධ විපර්යාස. මිථ්‍යාදුෂ්ටිකයන් පිස්සු වැටිලා දඟලනවා. මේ දේ මෙහෙම වුණොත් එහෙම මොකද වෙන්නෙ අපි කියන දේට අපි කරපු දේට අපි පෙන්නපු දේට කියන භය තියෙනවා. ඒ නිසා මිථ්‍යා දුෂ්ටිකයෝ කලබල වෙච්ච බවක් පෙනෙනවා භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ඉස්මතු වේගෙන එනකොට. ඒ නිසා ධර්මය ඉස්මතු වෙන එක වළක්වාලීම සඳහා විවිධ දේ කරනවා. ඒ කරන දේවල්වල සමහර අනිටු නරක ප්‍රතිඵල සමස්ත සමාජයටම විඳින්නත් සිද්ධ වෙනවා.

පින්වතුනේ,

අන්න ඒවායේ යම්කිසි බලපෑමක් තමයි අප ව්‍යවහාරයේ තියෙන පසුගිය ධර්ම දේශනාවලත් සාකච්ඡාවට බඳුන් කළ ස්වභාවික විපත්තීන් වශයෙන් හඳුන්වන සොබාදහමේ යම් යම් උපක්‍රම. අධම්මික සූත්‍රයෙන් බණ අහපු පින්වන්ත ඔබට තේරුණා මිනිසුන්ගේ අධාර්මිකභාවය සොබාදහම විෂම විදිහට පරිවර්තනය වෙන්ට බලපාපු බවක්. සොබාදහමේ විෂම පරිවර්තනය දෙවියන්ගේ ප්‍රකෝපයට හේතු වෙච්ච බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂාව සමව වහින්නෙ නැතිවීමත් ඒ හේතුවෙන් ශස්‍යයන් විෂම විදිහට පැහෙන බවත් ඔබ ඉගෙන ගත්තා.

පින්වතුනේ ලොව්තුරු තථාගත මගේ බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ ඉන්න කාලයේ ජේතවනාරාමයේදී හෝ පූර්වාරාමයේදී හෝ වෙනත් යම් තැනකදී භාග්‍යවතුන් වහන්සේගෙන්ම දහම් ශ්‍රවණය කරන්නට යෙදිච්ච දිව්‍යලෝකවල දෙවිවරුන්ට මනුෂ්‍ය ලෝකයේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් මේ වන විට අවුරුදු දෙදහස් පන්සිය හැට එකක් අපි ගත කළාට ඒ අයට සමහරවිට දවස් දෙකක් සමහර අයට දවස් දහයක් පහළවක් වාගේ පුංචි කාලයක්. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේගේ ඉගැන්වීම විකෘති කළොත් භාග්‍යවතුන් වහන්සේට හිමි තැන අහිමි කළොත් පෘථග්ජන ස්වභාවය තුළ ඉන්න එවන් වූ දේව කොට්ඨාශයන්ට යම්කිසි විදිහක සිත්තැවුල් ඇතිවෙන්නට පුළුවන්. ඒ හේතුව පදනම් කරගෙන ඒ අය සමහර විට පින්වතුනේ මෙවන් වූ ක්‍රියාදාමයන්ගේ නිරත වෙන අයට සොබාදහම විසින් ලබාදෙනවාය කියලා අප විසින් විශ්වාස කරන ඔය කියන ලද දේවල් සිදු කරන්නටත් පුළුවන්. මේ කාරණාව වරදවා ගන්ට එපා. දෙවිවරු විසින් මිනිසුන්ට අනුකම්පා කළ යුතුයි කියන තැනක ඉන්න සමහර කෙනෙකුට මේ කියමන සමහරවිට දී නරකට පාවිච්චි කරන්නට පුළුවන්. වැරදි විග්‍රහයක් සඳහා පාවිච්චි කරන්ටත් පුළුවන්. මම තවත් උදාහරණ සහිතව මේ කාරණාව පැහැදිලි කරනවා.

පින්වතුනේ, මහා පුණ්‍යවන්ත භූමියක් ශ්‍රී ලංකාද්වීපය කියලා කියන්නෙ. මේ මුළු ලෝකයම දරන්ට පුළුවන් මට්ටමේ මානසික මට්ටමෙන්, බුද්ධියෙන් උපරිම ඉහළට පත්වෙන්ට පුළුවන් පත්වෙච්ච උත්තමයන් වහන්සේලා වැඩසිටිය පුණ්‍යභූමියක්. අති පාරිශුද්ධ පුණ්‍යභූමියක්. අද නාසා ආයතනය පවා කියන්නෙ ලෝකයේ අඩුම ගුරුත්වාකර්ෂණය තියෙන්නෙ රටවල් වශයෙන් ගත්තහම ලංකාවට කියන බවත්. ලංකාවේ ඒ අඩුම ගුරුත්වාකර්ෂණය තියෙන කලාප නම් කරලා තිබෙනවා. යම් තැනක ගුරුත්වාකර්ෂණය අඩු නම් පින්වතුනේ ඉන් පැහැදිලි වන්නේ පහළට අදින ගතිය අඩුයි කියන එකයි. එහෙනම් අත් හරින්නට ලේසියි කියන එකයි ඉන් පැහැදිලි වන්නේ. ඒ නිසයි මේ රටේ අතීත මුතුන් මිත්තෝ අත්හැරීම ප්‍රගුණ කළේ. ඒ අත්හැරීමේ

ප්‍රතිඵලයයි තථාගත ශ්‍රී සද්ධර්මය උගන්වපු මාර්ග සහ ඵල කියලා කිව්වේ. මාර්ග සහ ඵලවලට පත්වීම භාග්‍යවතුන් වහන්සේ ඉගැන් වූ නිවන අත්දැකීමක් බවට පත්කර ගැනීම සඳහා අත් හැරීම මොන තරම් දායක වුණාද පින්වතුනේ. ලේසියෙන් අපිට තවමත් අත් හරින්න පුළුවන්කම තියෙන්නෙ මේ ගුණය නිසාමයි. ඒ නිසා මේ බිම ස්වභාවික පිහිටීම අතිනුත් පින්වතුනේ ලේසි පහසු පුණ්‍යභූමියක් එහෙම නෙවෙයි. ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වන විදිහටම සිව් බුදුවරයන් වහන්සේලාගේ පාද ස්පර්ශය ලබපු බවට සාධක සෙල්ලිපි ආදී දේවල්වලිනුත් සඳහන් වෙන කොට මොන තරම් පුණ්‍යභූමියක් ද කියලා ඉතා පැහැදිලියි. මේ පුණ්‍යභූමිය තුළ භාග්‍යවතුන් වහන්සේට හිමි වෙන්ට ඕන තැන යම් කිසි කෙනෙක් අහිමි කරනවා නම් ඒක පෘථග්ජන දෙවි දේවතාවරුන්ගේ ප්‍රකෝපයට හේතුවක් වෙන්ට පුළුවන්.

පින්වතුනේ, දැන හෝ නොදැන පින්වන්ත ඔබත් යම් යම් ධර්ම කාරණාවන් පිළිබඳව තිබෙන දුර්වල දැනුම නිසාවෙන් භාග්‍යවතුන් වහන්සේට ලැබෙන්න ඕන කරන තැන ඔබේ හදවතේ නිසි තැන නැහැ කියලයි පැහැදිලිව පෙනෙන්නෙ බහුතරයක් දෙනාගෙන්. මම එවන් අවස්ථා කීපයක් ඉස්මතු කරලා දෙන්නම්. බොහෝ තැන්වල තථාගත මගේ බුදුරජාණන් වහන්සේව දෙකේ කොළයට දාපු එකමයි කළේ. මෙය හිතාමතාම කරන ලද සැලසුමක ප්‍රතිඵලයක් විදිහටයි මට නම් පෙනෙන්නෙ දැනෙන්නෙ. ඒ මොකටවත් නෙවෙයි අවුරුදු දෙදහස් හයසීයක ඉතිහාසයක ඉඳලා භාග්‍යවතුන් වහන්සේට තැන දීගෙන ආපු මිනිසුන්ව එතනින් අයින් කරන්ට. තමන්ගේ හදවත බුදු කුටියක් බවට පරිවර්තනය කරමින් ජීවිතයේ හරි හම්බ කරගත්ත වටිනා කියන හැම දෙයක්ම බුදුහාමුදුරුවෝ වෙනුවෙන් ශාසනයට පරිත්‍යාග කරපු මිනිස්සුන්ගේ පරම්පරාව ඒකෙන් අයින් කරන්න කරපු සූක්ෂම සැලසුම් සහගත ක්‍රියා විදිහටයි මට හිතෙන්නෙ. අනුරාධපුරයට පොළොන්නොරුවට ගියහම තියෙන හරියක් තියෙන්නෙ වෙහෙර, විහාර, ආරාරාම, ආරාම ගොඩ නගාපු ඒවායේ නටබුන් විතරයි. එක ගෙයක් තිබ්ච්ච

තැනක සලකුණක් නැහැ. මෙතරම් රජවරු පාලනය කරපු මේ රටේ රාජ මාලිගාවල නටබුන් තියෙන්නෙ කීයෙන් කීයද? තියෙන හරියක් නටබුන් සංඝාරාම, සංඝාවාස, බුදුගෙවල්. බලන්ට මේකෙන් පෙනෙන්නෙ මොකක්ද? බුදුදහමට අනුව හැඩගස්වා ගත්ත ජීවිතයක් ගත කරපු අපේ මුතුන්මිත්තෝ තමන්ට ජීවිතයේ ලැබිච්ච වටිනාම දේ නිතරම පරිත්‍යාග කළේ තුනුරුවන්ට. තමන් පැල්පතක ඉඳගෙන කටුමැටි ගෙයක ඉඳගෙන නිතරම තුනුරුවන්ට භාග්‍යවතුන් වහන්සේට මහා සංඝරත්නයට මහා කළුගල්වලින් නිර්මාණ හදලා පන්දාහක් කල් මේ ශාසනය පවතින තුරාවට නොනැසෙන විදිහේ නිර්මාණයන් කරමින් සසුනට තමන්ගෙ ජීවිතයේ වටිනාම දේවල් ටික පරිත්‍යාග කළා. මුතු හම්බ වුණාද මැණික් හම්බ වුණාද රත්තරන් හම්බ වුණාද ඉන් කරන ලද සියලු නිර්මාණයන් ශාසනයට කරපු නිර්මාණයන්මයි. කෞතුකාගාරයේ ඉතුරුවෙලා තියෙන එකී වටිනා නිර්මාණවල සියල්ලම පසුබිම තියෙන්නෙ ශාසනයට. බුදුහාමුදුරුවෝ, මහා සංඝරත්නය. කෝ ගෙවල් දොරවල්වල වටිනා දේවල් පාවිච්චි කළ බවට සාධක. හරිම අඩුවෙන් තියෙන්නෙ. ඇයි මේ ඒ තරමටම භාග්‍යවතුන් වහන්සේට තමන්ගේ ජීවිතයේ තැන දීලා තිබුණා. භාග්‍යවතුන් වහන්සේ වෙනුවෙන් තමන්ට පරිත්‍යාග කළ නොහැකි දෙයක් තමන් ළඟ තිබුණෙ නැහැ. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීයාමට පසුවත් එහෙමමයි පින්වතුනේ කළේ මැණික්වල, රත්තරන්වල උන්වහන්සේගේ ධාතුන් වහන්සේලා තැන්පත් කරලා ඒවා වෙහෙරවල තැන්පත් කරලා වැන්දා පිදුවා ආරක්ෂා කළා. අන්න භාග්‍යවතුන් වහන්සේට තිබිච්ච තැන. ඒ නිසා ලෝකයේ කිසිවකුට දෙවැනි නැති ඔලුව පහත් කරන්නෙ නැති මහා සංස්කෘතියක උරුමක්කාරයෝ මහා පෞඩ ඉතිහාසයේ උරුමක්කාරයෝ ස්වාධීනව නැගී සිටින ලෝකය දිනන ලෝකයට වුවමනා කරන කරුණාව, දයාව නිතරම වැස්සෙන පිරිසක් හිටියනම් ඒ මේ ශ්‍රී ලංකාද්වීපයේ පමණයි. තථාගත දහමින් නැහැවෙච්ච මිනිස්සු පමණයි. මේකට කවුරු හෝ ඊර්ෂ්‍යා කළා. මේක කාට හෝ දරාගන්ට

බැරිවුණා. ඔහු හෝ ඇය තනි පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් වියහැකියි. ඒ නිසා පින්වතුනේ ඔබට නොදැනෙන්න ඔබෙන් භාග්‍යවතුන් වහන්සේව උදුරා ගත්තා. ඔබෙන් බුදුපියාණන් වහන්සේව ඈත් කළා. ඒවා බණ පොතට ඇතුළත් කරලා බණේ තියෙන කාරණා විදිහට අද වෙන කොට අදහන්ට ඔබ උත්සුක වෙලා තියෙනවා. පෙළඹිලා තියෙනවා. මම එවැනි අවස්ථා කීපයක් කියන්නම් භාග්‍යවත් තථාගත මගේ බුදුරජාණන් වහන්සේව දෙකේ කොළයට දාපු තැන්. උන්වහන්සේව දෙවැනියා කරලා වෙනකාව හරි ඉස්මතු කරගත්ත තැන් මේ කියලා දෙන්න හදන්නෙ. ඒ කියන්නෙ දැනටත් මේ කියන තත්වය තේරුම් අරන් තථාගත බුදුරජාණන් වහන්සේට මේ රටේ ලැබෙන්න ඕන තැන ලැබුණොත් මේ කිසිදු ස්වභාවික විපතක් හෝ අතුරු අන්තරාවක් නැත. සෞභාග්‍යමත් රටක් නැවත ගොඩනගාගන්ට අවශ්‍ය නම් එදා තථාගත මගේ බුදුහාමුදුරුවන්ට මේ රටේ තිබ්ච්ච තැන අදත් ලැබෙන්ටම අවශ්‍යයි.

පින්වතුනේ,

කොයි කොයි තැන්වලද බුදුහාමුදුරුවන්ට තිබ්ච්ච තැන නැති කළේ. පටන් ගන්න තැනක් මම කියන්නම්. ආරම්භයක් කියන්නම්. ඔන්න තියෙනවා පොතක භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුදු පදවිය ලබලා ලෝකයා දෙස බලලා කෙලෙස්වලින් පිරිච්ච මේ ලෝකයාට මට නම් බණ කියන්න බැහැ. මම කියන බණ මේ අයට තේරෙන එකක් නැහැ. මේ අයට බණ කියන්න ගිහිල්ලා මම කලන්තෙ දාලා වැටෙයි. උන්වහන්සේ උකටලී වුණාලු, කම්මැලි වුණාලු, පස්ස ගැහුවලු බුදුවෙලා ලෝකයාට බණ කියන්න. එතකොට බ්‍රහ්ම ලෝකයේ ඉඳලා ආපු ප්‍රධානියා බ්‍රහ්මයා සහම්පතී බ්‍රහ්මයා තථාගත බුදුරජාණන් වහන්සේට ආරාධනා කළාලු හා හා එහෙම හිතන්න එපා බුදුහාමුදුරුවනේ බණ තේරුම් ගන්න පුළුවන් මිනිස්සුත් මේ ලෝකේ ඉන්නවා. ඒ අය කෙරෙහි අනුකම්පාවෙන් බණ දේශනා කරන්ට කියලා. මේ ගැන අනන්ත විග්‍රහ තියෙනවා කිසිවෙකුගේ ආරාධනාවක් නැතිව බුදුවරු බණ කියන්නෙ නැහැයිය

කියලා තව සමහර පොත්පත්වල කියනවා. සමහර අයගෙ ඉගැන්වීම් තුළ තියෙනවා. මට නම් ගැටලුවක් ඇති වුණා මුළු ලෝකවාසීන් විඳින දුකින් නිදහස් කරවීම පිණිස අතට පත්වෙච්ච නිවන දීපංකර තථාගතයන් වහන්සේගේ කාලයේ අහකට දාලා එතන ඉඳලා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා පුරමින් නොවිඳිනා දුක් කන්දරාවන්වලට මුහුණ දෙමින් ජීවිත පරිත්‍යාගයෙන් පාරමී උපපාරමී පරමත්ත පාරමී සම්පූර්ණ කරලා ගෞතම නමින් සම්මා සම්බුදු පදවියට උන්වහන්සේ පත්වුණේම ලෝකසත්වයා දුකින් නිදහස් කරන්න නම් ඇයි මහා බ්‍රහ්මයා ආරාධනා කරනකම් ඉන්ට වුණේ. තව කාගෙවත් ආරාධනාවක් අවශ්‍යද උන්වහන්සේට බණ දේශනා කරන්න. උන්වහන්සේ කාගෙවත් ආරාධනාවක් නිසාද බුදු වුණේ තමන් වහන්සේටම හිතිලද බුදුවුණේ?

ලෝකයා වෙත පතළ මහා කරුණාව ඇති තථාගතයන් වහන්සේ තත්පරයක්වත් අහක දාන්නෙ නැහැ පින්වතුනේ බණ දේශනාවෙන්. එය වළක්වාලීම වෙනුවෙන්. බණ දේශනා නොකර ඉන්න තත්පරයක් අහක දාන්නෙ නැහැ. උන්වහන්සේට හතළිස් පස් වර්ෂය මදි අවබෝධ කරගත්ත ධර්මය දේශනා කරන්න. ඒ නිසා උන්වහන්සේ දවසේ පැය විසි හතරෙන් පැය විසි දෙකක් විසිඑකහමාරක්ම උන්වහන්සේ කළේ ලෝක සත්වයාට අනුකම්පාවෙන් දහම් දේශනා කරපු එකමයි. එහෙව් තථාගත මගේ බුදුරජාණන් වහන්සේ ලෝකයා වෙනුවෙන් බුදු වෙච්ච උන්වහන්සේ ලෝකයාට බණ කියන්ට ගිහින් මම කලන්තෙ දාලා වැටේය කියලා උකුටලී වුණා කිව්වහම ඒ හේතුවෙන් එය දැකපු මහා බ්‍රහ්මයා හා එහෙම කරන්න එපා කියලා කිව්වා නම් දැන්මෙ තථාගත මගේ බුදුහාමුදුරුවන්ව දෙකේ කොළයට නොවෙයිද? කවුද එකට ගත්තෙ මහා බ්‍රහ්මයාව. මහා බ්‍රහ්මයාව. ඔන්න පින්වතුනේ පෙනෙනවද යම්කිසි කෙනෙක් හෝ කණ්ඩායමක් හෝ විසින් කරන ලද සූක්ෂම සහගත සැලසුමක ප්‍රතිඵලයක් යැයි මට හැඟී මම ඔබට කියපු කාරණාව. බමුණු දහමේ මහා බ්‍රහ්මයාට තැන දෙන්නෙ. බමුණු දහමේ මහා බ්‍රහ්මයාට තියෙන තැන තමයි

තථාගත මගේ බුදුහාමුදුරුවන්ට මෙතනදි තිබ්ච්ච තැනක් අයින් කරලා ආයෙමත් දෙන්න කටයුතු කළේ. එය කළේ කවුද කියලා පින්වතුන් විසින් අවබෝධ කරගනිත්වා.

පින්වතුනේ,

ආයෙමත් අපේ උපාසක අම්මලා කියනවා භාග්‍යවතුන් වහන්සේ උදෑසන පිණ්ඩපාතයේ වැඩම කිරීමට ලක ලැහැස්ති වෙලා දිවැසින් බලනවලු අද දානේ ලැබෙන පැත්තෙ අය දුප්පත් ද? අද ලැබෙන්නට තියෙන දානය අඩුපාඩු සහිතද? ඔව් එහෙම අඩුපාඩු සහිත නම් අද ලැබෙන දානය භාග්‍යවතුන් වහන්සේ කියනවලු අද සීවලී මාත් එක්ක පිණ්ඩපාතයේ යමු කියලා. මේ බණ පොතක දේශනාවක තියෙන එකක් නෙවෙයි. මම කියන්නෙ ව්‍යවහාරයේ බොහෝ අය ළඟ තියෙන එකක්. ඇයි මේ සීවලී හාමුදුරුවෝ මාත් එක්ක යමු කියන්නෙ. මේ සමාජයේ මේ මතය දරණ ගොඩක් අය සිතන් ඉන්නෙ සීවලී මහරහතන් වහන්සේට තිබෙන ප්‍රත්‍යලාභීන් අතර අගතනතුර භාග්‍යවතුන් වහන්සේවත් ඉක්මවා ගියපු එකක්ය කියලා. උන්වහන්සේට ගිය ගිය තැන ප්‍රත්‍යය නම් ලැබෙන බව සැබෑය. උන්වහන්සේ කාන්තාරයේ ගියත් දානය වරද්දන්න බැරි බවත් සැබෑව. උන්වහන්සේ ගලක් උඩට වෙලා වැඩි සිටියත් දානේ හම්බවෙන බවත් සැබෑව. පින්වතුනේ භාග්‍යවතුන් වහන්සේව දෙකේ කොළයට දාන්න එපා. උන්වහන්සේට හිමි තැන නැති කරන්ට එපා. සීවලී හාමුදුරුවෝ කියන්නෙ ගෝල හාමුදුරුවෝ. භාග්‍යවතුන් වහන්සේ ගුරුහාමුදුරුවෝ උන්වහන්සේ ගුරුවරයාණන් වහන්සේ. සීවලී හාමුදුරුවෝ ඇතුළු අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා දරණ ලද තනතුරු ශ්‍රාවකයන්ට විතරයි සාධාරණ.

"මම ශ්‍රාවකානං යදිදං අග්ගෝ ලාභීනං ලාභීනං මම ශ්‍රාවකානං යදිදං අග්ගෝ සීවලී මහාථේරෝ"

ලාභීන්ගෙන් මගේ ශ්‍රාවකයන් අතර අග්‍රස්ථානය සීවලී මහ තෙරුන්වහන්සේ. එහෙමයි තථාගත මගේ බුදුහාමුදුරුවෝ දීපු ඔය කියන තනතුරේ තියෙන්නෙ. මගේ ශ්‍රාවකයන් අතරෙන් අග්‍රස්ථානය

ලැබීම් වලින් තියෙන්නේ සීවලී මහ තෙරුන් වහන්සේට.එතකොට මම එතන නැහැ. ඒ කියන්නෙ භාග්‍යවතුන් වහන්සේ එතන නැහැ. භාග්‍යවතුන් වහන්සේ හැර ශ්‍රාවකයන් අතරෙන් ලැබීම්වල අග්‍රස්ථානය තියෙන්නේ සීවලී මහ රහතන්වහන්සේට. කවුරුහරි කියනවා නම් බුදුහාමුදුරුවෝ දානය අඩුවෙන් ලැබෙනවාය කියලා දිවැසින් දැකලා අද සීවලී මාත් එක්ක යන් කියලා පින්වතුනේ මොනවද මේ ධර්මය ගැන දන්නේ. කෝ බුදුහාමුදුරුවෝ ගැන දැනුම කියලා මට නම් සංවේගයක් තමයි ඇති වෙන්නේ. දැම්මා එතනත් භාග්‍යවතුන් වහන්සේව දෙකේ කොළයට.

පින්වතුනේ මහාවංශයේ තියෙනවා තවත් මහ පුදුම කියමනක්. තථාගත මගේ බුදුරජාණන් වහන්සේගෙන් උන්වහන්සේ පිරිනිවී ගියහම කවුද නායකත්වය දෙන්නෙ කියලා අහපු හැම වෙලාවකදීම මහරහතන් වහන්සේලාට ආනන්ද මහ තෙරුන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළේ මගෙන් පස්සෙ මහණෙනි, පින්වතුනි නුඹලාගේ ශාස්තෘන් වන්නේ නිර්මල දහමයි කියලයි තියෙන්නෙ. ඒ නිසා මේ ශාසනයේ මගෙන් පසුව පාලකයෙක් නැහැ. පාලනය වෙන්නෙ ධර්මයෙන්. ධර්මය තුළින් ධර්මයට අනුගතවීමෙන්. පිරිස් පාලනයක් නැහැ ඒ නිසා ශාසනය බුදුහාමුදුරුවෝ කාටවත් පැවරුවේ නැහැ. එහෙමයි බණේ තියෙන්නෙ.

අන්න මහාවංශයේ කියනවා විජය රජ්ජුරුවන් රකින්න භාග්‍යවතුන් වහන්සේ ශක්‍ර ද්වේන්ද්‍රයාට පැවරුවාය. ඊට හේතුව භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය රැකෙන්නෙ ශ්‍රී ලංකා මහාද්වීපයේය. ශ්‍රී ලංකාද්වීපයට නායකත්වය දෙන්නෙ විජය රජ්ජුරුවෝය. ඒ නිසා උපුල්වන් දෙවියෝ මීට වගබලා ගනිත්වාය කියලා සඳහන් කරලා තියෙනවා මහාවංශයේ. තථාගත මගේ බුදුහාමුදුරුවන් ආයෙමත් සැරයක් දැන් දෙවැනි තැනට දැම්මා නේද? පින්වතුනේ සැරියුත් මහරහතන් වහන්සේට නොදීපු මේ ශාසනයේ පාලනය දේවදත්ත හාමුදුරුවෝ ඉල්ලුවහම සිවුරක් දරණ උන්වහන්සේටවත් නොදීපු මේ ශාසනයේ පාලනය ධර්ම

උරුමක්කාරයන්ව සමූල ඝාතනය කරලා නැති කරලා දාන එක භාග්‍යවතුන් වහන්සේට නොපෙනී ඔහුගෙන් ආරම්භ වෙච්ච පිරිසෙන් මේ ලංකාද්වීපය තුළ ශාසනය රැකෙනවාය කියලා භාග්‍යවතුන් වහන්සේට පෙනුණාය කියලා කොතන හරි තියෙනවා නම් ඒ බුදුපියාණන් වහන්සේව හඳුනා නොගත් කෙනෙක් කරපු ප්‍රකාශයක් නෙවෙයිද? තවත් තියෙනවා පින්වතුනේ බොහෝ කොට. භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වැඩම කළාලු දාසය පොළකට වැඩියලු. උන්වහන්සේට මොනවහරි අසනීපයක් තිබුණද දන්නෙ නැහැ මේ කියන කියමනේ හැටියට නම් කැලෑවල්වලට වනාන්තරවලට වැඩම කරලා කාලය අපතේ දාන්ට. සොළොස්මස්ථාන වශයෙන් හඳුන්වන තැන් ජනාකීර්ණ තැන් නොවේ නම් භාග්‍යවතුන් වහන්සේට අසනීපයක් තියෙන්ට ඇති කැලෑවල්වලට වැඩලා කාලය ගතකරලා දාන්ට. ඔය හැම තැනකම පින්වතුනේ මහා ජනාවාස තිබුණා. ඒ ජනාවාස තිබිච්ච තැන්වලට භාග්‍යවතුන් වහන්සේ වැඩම කරලා එකී සියලුම ජනතාවට උන්වහන්සේ ධර්මය දේශනා කළා. මේ ඉතිහාස පොතේ හැටියට නම් තුන් වතාවක් දාසය පොළකට වැඩම කරලා ගුරුවරයන් වහන්සේට කරන්න බැරි වෙච්ච දේ එක පාරින් වැඩම කරලා ගෝල හාමුදුරුවෝ ඒ ඉටුකරලා තියෙන්නෙ. ඒ මිහිඳු මහ රහතන් වහන්සේ. දැම්මා එතනත් තථාගත මගේ බුදුහාමුදුරුවන්ව දෙකේ කොළයට.

අද අපේ රටේ භාග්‍යවතුන් වහන්සේට නැති තැනක් මිහිඳු මහරහතන් වහන්සේට තියෙනවා. කෙනෙකුට මේ කියන එකත් තව ප්‍රශ්නයකට හේතුවක් හදාගන්න පුළුවන් එහි වරදක් තියෙනවාද කියලා. ඇයි වරදක් නැත්තෙ. ගුරුවරයාණන් වහන්සේට තුන් වතාවක් ඇවිල්ලා මේ ලංකාවේ ශාසනය පිහිටු වන්න බැරි වුණාලු ගෝලයා ඇවිල්ලා එක පාරින් පිහිටෙව්වාලු. මේ කළේ මිහිඳු මහ රහතන් වහන්සේටත් නිගරු කිරීමක්. මේ කළේ තථාගත මගේ බුදුහාමුදුරුවන්ටත් නිගරු කිරීමක්. බලන්න කල්පනා කරලා

භාණ්ඩාගාරික ආනන්ද මහතෙරුන් වහන්සේට දීපු නැති මේ ශාසනයේ පාලනය කාටද මේ දුන්නා කියලා මහාවංශයේ කියන්නෙ. හරි පුදුම දේ තමයි පින්වතුනේ තම රටට එපාවෙලා තම පියතුමාට එපාවෙලා මරන්න බැරි තැන මැරියන්ය කියන හැඟීමෙන් හංවඩු ගහලා මුහුදට තල්ලුකරලා දාපු ඒ විතරක් නෙවෙයි සල්ලාලකම් කරලා ජඩකම් කරලා පහත් ක්‍රියාවන් කරලා රටෙන් නෙරපා දාපු පුද්ගලයාව රකින්ට භාග්‍යවතුන් වහන්සේ ශක්‍රයාට පැවරුවයි කිව්වහම මේ තරම් තවත් නින්දාවක් කරාද කවුරුත් භාග්‍යවතුන් වහන්සේට.දේවදත්ත හාමුදුරුවෝ මුහුණට ඇවිත් ගල් පෙරලලායි නින්දා කරලා තියෙන්නෙ. ඒ නින්දාවට වඩා මේ නින්දාව මොන තරම් නම් බරපතලද? ඒ විතරක් නෙවෙයි අනාගතයේ ශාසනය පවතින්නේ ශ්‍රී ලංකාවේය. එහි පාලකයා වන්නේ විජය රජ්ජුරුවෝය. මේ සියල්ල භාග්‍යවතුන් වහන්සේට දිවැසින් පෙනුණා මේ පොතේ හැටියට. මහා වංශයේ හැටියට. ඒත් භාග්‍යවතුන් වහන්සේට පෙනුණෙ නැහැ ඒ සල්ලාල විජය ඇවිල්ලා මේ රටේ උරුමක්කාරයන්ව සමූල ඝාතනය කරලා දාන එක. කුවේනි ඇතුළු මේ රටේ අයිතිය තිබ්ච්ච ඒ සම්පූර්ණ අයිතිකාරයන්ව සමූල ඝාතනය කරනවා භාග්‍යවතුන් වහන්සේට පෙනුණෙ නැහැ කියලා මහා වංශයේ කියන එක තරම් තථාගත මගේ බුදුහාමුදුරුවන්ට කරපු තවත් අපහාසයක් තියෙනවද පින්වතුනේ. ඔබට හිතන්නයි මම මේවා කියන්නේ. බලන්න බුදුහාමුදුරුවන්ව දෙකේ කොළයට දැම්මා. එතනත් ශක්‍රයෙක්ව උපුල්වන් දෙවියන් ඉස්සරහට අරගත්තා. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය කෙනෙකුට රකින්න පුළුවන්ද බැරිද කියලා මම කලින් බණට කියලා දීලා තියෙනවා. සම්බුද්ධ ශාසනය කියන්නෙ කාටවත් රකින්න පුළුවන් එකක් නෙවෙයි. තම තමන් පෞද්ගලිකව රකින්ට ඕන එකක්.

“ඒතං බුද්ධාන සාසනං” කියන බණ පදය මම විග්‍රහ කරලා දුන්නා කලින්. පුදුම දේ කියලා කියන්නෙ පින්වතුනේ රටේ සැබෑ

පින්වතුනේ.

ඒ නිසා භාග්‍යවතුන් වහන්සේට සම්බුද්ධ ශාසනයට පූජා කළ දේවල් ඒවා මිල කරන්න බැරි වටිනා පුරාවස්තු මේ වන විට කොල්ල කනවා. මංකොල්ල කනවා. ඒවා විනාශ කරලා දානවා. ඒවායේ සැබෑ අයිතිකාරයන්ගෙන් ඒවා උදුරාගෙන එහෙම නැත්නම් ඒවාට යම්කිසි මිලක් දීලා මොන ක්‍රමයකින් හරි කරන්නේ උදුරාගෙන වෙන රටවල්වලට අරගෙන යනවා. අපිට තියෙන අයිතිය නැති කරනවා. භාග්‍යවතුන් වහන්සේ මේ ශ්‍රී ලංකාද්වීපය තුළ වැඩහිටිය බවට තියෙන සාධක විනාශ කරලා දානවා. උන්වහන්සේට හිමිතැන නැති කරලා දානවා. ඔය මම කීපයක් පමණයි කීවේ. මේ මේ ආදී දේවල්වලින් සහ සසුනට උරුම වෙච්ච අතීතයේ මුතුන්මිත්තෝ පරිත්‍යාග කරපු දේවල් සොරාකෑමේ ප්‍රතිඵලයක් සහ ඒවා එසේ වන්නට ඉඩදී නොදැක්කා සේ පාලකයන් කටයුතු කිරීමේ ප්‍රතිඵල තමයි පින්වතුනේ මේ රට හැමදාමත් දිළිඳු රටක්.

අපි පාසැල් යන කාලයේ යන්තම් තේරෙන වයසෙදී පාසැලේ පහ වසරේ හය වසරේදි අපිට අපේ ගුරුවරු ඉගැන්නුවේ ශ්‍රී ලංකාද්වීපය සංවර්ධනය වෙමින් පවතින රටක් දියුණු වෙමින් පවතින රටක් කියලා. මේවා අහලා දැන් අවුරුදු කීයක් ගියාද තාමත් මේ රටේ දරුවන්ට උගන්වන්නේ ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් කියලා. කවදාද මේ රට සංවර්ධිත රටක් බවට පත්වෙන්නෙ. පෙනෙන තෙක් මානයකවත් නැහැ එහෙම ලකුණක්. මේ රට සංවර්ධනය කරන්න බැහැ අධ්‍යාත්මික නායකතත්වයකින් තොරව. ඉන්න පාලකයන් තුළ දැහැමි සිතුවිලි පහළ වෙන්නෙ නැති තාක්කල් මේ රට සංවර්ධනය කරන්ට බැහැ. මේ රටේ උරුමය සදාචාරය. මේ රටේ උරුමය ධර්මය. ඒ තථාගත ශ්‍රී සද්ධර්මය. ඒ යුක්තිය. ඒ සාධාරණය. එයට තැන නොලැබෙන තාක්කල් මේ රට දියුණු කරන්න බැහැ පින්වතුනේ. ඒ නිසා අධාර්මික නායකත්වයන් තියෙනවානම් යම් තැනක එය රටක ජාතියක

පරිහානිය කියන බව භාග්‍යවතුන් වහන්සේගේ පැහැදිලි කිරීම තුළින් පසුගිය දෙසතියේ අධාර්මික සූත්‍රයෙන් තේරුම් කරලා දුන්නා.

අපි දහමට අනුව ජීවිතය හැඩගස්වා ගත්ත පරම්පරාගත මිනිස්සු. ඒ නිසා යම් යම් තැනකදී කොයි තරම් වැටුණත් වැටිච්ච සැනින් නැගිටින්න පුළුවන්කම තිබුණේ පින්වතුනේ තථාගත ශ්‍රී සද්ධර්මය නිසා. භාග්‍යවතුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව හැඩගස්වා ගත්ත ජීවිතයක් තියෙන පරම්පරාගත මිනිස්සු නිසා. මේ රටට මේ වනවිට ආපු විපත්තිදායක තත්වයන් වසර දෙකක් වගේ කෙටි කාලයක් ඇතුළත පින්වතුනේ බුදුදහම නොපවතින්න හිස ඔසවන්න හම්බ වෙන්නෙ නැහැ කීයටවත්. මම එහෙම කියන්නෙ තව කෙනෙකුට උදව් උපකාර කරන්ට උණුවෙන හදවතක් ඇති මිනිස්සු බිහි වුණේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය නිසා. එවන් මිනිසුන්ගෙන් ගැවසී ගත්ත රටක් නිසා. මේ රටේ යම් තැනක කාට හෝ විපතක් සිදුවුණා නම් ඔහු ගලවා ගන්ට ඔහුට උදව් කරන්ට ඔහු නැගිට්ටවන්ට ඒ සානුකම්පිත පරම්පරාගත හදවත් ඇති මිනිස්සු නිතරම ඉදිරිපත් වුණා. මෙවරත් ගංවතුර, නායයෑම් ආදියෙන් විපතට පත්වෙච්ච මිනිසුන්ට පින්වන්ත ඔබ මොනතරම් පරිත්‍යාග කළාද? කවුද ඔබට මේ මෙහෙයවීම කළේ? ඒ මෙහෙයවීම කළේ ඔබේ පාලකයෝද? නැහැ ඔබට පරම්පරා උරුමයක් තියෙනවා. ඒ තථාගත මගේ බුදු හාමුදුරුවෝ උගන්වපු ධර්මය රකින පරම්පරාවල මිනිස්සු නිසා. ඒ භාග්‍යවතුන් වහන්සේයි එහි නායකත්වය ලබාදුන්නෙ.

"දත්වාච භුත්වාච යථානුභාවා" දෙන්ට ඕන. කන්ට ඕන. "දත්වාච භුත්වාච" දීලා කන සිරිතක් හදාගනිල්ලා කියලා උන්වහන්සේ පැහැදිලි කරලා තිබිච්ච ඉගැන්වීම. බෝසත් කාලයේදී දවසේ පැය විසිහතරම හැම භවයකදීම මුළු ජීවිතයම අන් අය වෙනුවෙන් පරිත්‍යාග කරපු ලෝකයේ පරමාදර්ශී එකම චරිතය අප මහා බෝසතාණන් වහන්සේගේ චරිතය. ඒ චරිත කතා කියව කියවා

සම්, ලේ, මස්, ඇට, ඇට මිදුළු, අස්සේ කාවැදිච්ච පරම්පරා ගත ජාන ඔබට මට තියෙන්නෙ. අන්න ඒ නිසා තමයි අදත් මෙවරත් මත්තටත් ඔබ අසරණයන්ට තරාතිරම නොබලා පිහිට වෙන්න උත්සුක වුණේ. ඔබ එහිදී ආගම බැලුවෙ නැහැ. ජාතිය බැලුවෙ නැහැ. ඔබට ඒක වැඩක් නැහැ. භාග්‍යවතුන් වහන්සේ ඉගැන්වූයේ නැහැ එහෙම කරන්ට උන්වහන්සේට ජාති භේද තිබිච්ච නැති නිසා. සමහර අය එහෙම කළත් බෞද්ධ ඔබ එහෙම කළේ නැත්තෙ භාග්‍යවතුන් වහන්සේගේ දහමේ උගන්වපු සමානාත්මතාව නිසාමයි. ඒ වගේම පින්වතුනේ මොනතරම් නම් පරිත්‍යාග සිදු කළාද විපතට පත්වෙච්ච අයට ඉන් නැගීසිටීම සඳහා. ඒ සම්පූර්ණ හුරුව අපට දුන්නෙ භාග්‍යවතුන් වහන්සේ. ගම් නියම්ගම්වල වැඩම කරමින් අව්ව වැස්ස නොබලා ඒ වගේම කණු කටු ආදී දේවල් පය ගැටෙන්ට ඇති. ඒවා නොබලා දෙපයින් වැඩම කරමින් අවම වශයෙන් සෙරෙප්පු දෙකක්වත් දාන්නෙ නැතිව පාවහන් පාවිච්චි කරන්නෙ නැතිව තථාගත මගේ බුදුහාමුදුරුවෝ අපිට දීපු නායකත්වය. එය පරම්පරාවෙන් පරම්පරාවට උරුම කරගෙන ආපු නිසා අපි ගාව තවමත් තියෙන්නෙ දෙන්න ලැහැස්ති පිට සූදානම් වෙච්ච හිතක් සහ අතක්. "හත්තස්ස්‍ය භූසනං දානං" අතට දාන වටිනම ආභරණය මුද්දවත්, වළල්ලවත්, බ්‍රේස්ලට් එකවත් එහෙම නෙවෙයි. අතට තියෙන වටිනාම ආභරණය, පරිත්‍යාගය අතින් අල්ලලා කරන පරිත්‍යාගය පින්වතුනේ. ඒ නිසා මේ රට නැවත පරිවර්තනය වුණොත් සීඝ්‍රයෙන් ධාර්මික පැත්තට ඔන්න පින්වතුනේ නැවතත් අපිට සිටිය තැනට එන්න පුළුවන්. අපි මේ ලෝකයේම දියුණුම ජාතිය. දියුණුම රට. ඒවා බොහෝ අය අමතක කරලා තියෙන්නෙ. නැවත අපට එතනට සීඝ්‍රයෙන් එන්න අවශ්‍යනම් අන්න ධම්මික සූත්‍රයේ තියෙනවා ක්‍රමවේදය.

> "ගුන්නං චේ තරමානානං
> උජුං ගච්ඡති පුංගවෝ."

තරණය කරන ගොනුන් අතරේ පුං ගවයා, ප්‍රධාන ගවයා, නායක

ගවයා එයා　　‘‘සබ්බා තා උජුං ගච්ඡන්ති

නෙත්තේ උජුගතේ සති.”

එයා කම්මැලි නැතිව සෘජුව යනවා නම් ප්‍රධාන ගවයා කම්මැලි නැතිව සෘජුව යනවා නම් “සබ්බා තා උජු ගච්ඡන්ති.” ඔහු පසු පස්සෙ එන අනිකුත් සියලුම ගවයෝ “උජු ගච්ඡන්ති.” සෘජුව ගමන් කරනවා. කෙළින් ගමන් කරනවා.

“ඒව මේව මනුස්සේසු”

ඔන්න භාග්‍යවතුන් වහන්සේ උපමාවක් දුන්නා. ඔය උපමාවේ අනුසාරයෙන් ඒ පරිද්දෙන් “මනුස්සේසු” මිනිසුන් කෙරෙහි “යෝ හෝති සෙට්ඨසම්මතෝ” කවුරු හරි මිනිහෙක්ව ශ්‍රේෂ්ඨ සම්මත කරගෙන තියෙනවාද? ශ්‍රේෂ්ඨ සම්මත කියන්නෙ ජනාධිපති කියන එකමයි. සම්මතය තුළින් කවුරුහරි ජ්‍යෂ්ඨයෙක් පත්කර ගත්තා නම් ශ්‍රේෂ්ඨයෙක් පත්කර ගත්තා නම් එයා තමයි සෙට්ඨ සම්මතෝ කියන්නෙ. ඒ ශ්‍රේෂ්ඨ සම්මත පුද්ගලයා

“සෝ චේව ධම්මං චරති පගේව ඉතරා පජා.”

දහම් පුරනවා නම් ශ්‍රේෂ්ඨ සම්මත පුද්ගලයා ඉතිරි ප්‍රජාවම “ඉතරා පජා” ඉතිරි ප්‍රජාවම ඒ කියන්නෙ ජනතාව “සබ්බං රට්ඨං සුඛං සේතී.” මුළු රටම “රාජා චේ හෝති ධම්මිකෝ.” ධාර්මික රාජ්‍යයක් බවට පත්වෙනවා. සුඛිත, මුදිත රාජ්‍යයක් බවට පත්වෙනවා. ඒ කියන්නෙ උපමාවේ දුන්නෙ ප්‍රධාන ගවයා කෙළින් යනවා නම් ඉතුරු ගවයෝ කෙළින් යන බවත්. ඒ උපමාවට අනුසාරයෙන් පාලකයන් ධාර්මික නම් ප්‍රජාවත් ධාර්මික වෙනවාය එතකොට. “සබ්බං රට්ඨං සුඛං සේතී.” මුළු රටම සැපවත් වෙනවය සුඛිත,මුදිත වෙනවය “රාජා චේ හෝති ධම්මිකෝ.” රජු ධාර්මික වීම තුළ කියලා දක්වලා තියෙනවා. එතකොට ධම්මික සූත්‍රයෙහි උගන්වන්නේ අධම්මික සූත්‍රයේ තිබ්බච්ච කාරණාවේ පරස්පරයයි. නැත්නම් ඒකේ අනෙක් පැත්තයි.

“යස්මිං භික්ඛවේ සමයේ රාජානෝ ධම්මිකා හොන්ති.” මහණෙනි, පින්වතුනේ යම් කලෙක රජවරු ධාර්මික

වෙනවද "රාජ යුත්තාපි තස්මිංසමයේ ධම්මිකා හොන්ති." අන්න එතකොට කැබිනට් එක නැත්නම් අමාත්‍ය මණ්ඩලය රාජපුරුෂයෝ ධාර්මික වෙනවා.

"රාජ යුත්තේසු ධම්මිකේසු බ්‍රාහ්මණ ගහපතිකාපි තස්මිං සමයේ ධම්මිකා හොන්ති."

ඔන්න අමාත්‍යවරු ධාර්මික වෙන කොට බ්‍රාහ්මණ ගෘහපතීන් ධාර්මික වෙනවාලු. "බ්‍රාහ්මණ ගහපතිකේසු ධම්මිකේසු නෙගම ජනපදාපි තස්මිං සමයේ ධම්මිකා හොන්ති."බ්‍රාහ්මණ ගෘහපතීන් ධාර්මික වුණහම ඒ පාර ගම්නියම්ගම්වල මිනිස්සු ධාර්මික වෙනවාලු. "නෙගම ජනපදේසු ධම්මිකේසු සමං චන්දිම සුරියා පරිවත්තන්ති." ගම්නියම්ගම්වල මිනිස්සු ධාර්මික වෙන කොටම ඉර හඳ දෙක විෂම වෙලා තිබිච්ච ඉර හඳ දෙක සමව පරිවර්තනය වෙන්න පටන් ගන්නවලු. සෞම්‍ය කිරණ සෞම්‍ය රැස් දාරාවල් ඉරෙන් හඳෙන් නිකුත් කරන්න පටන් ගන්නවාලු. එතකොට ඉර හඳ දෙක සම වුණහම "සමං චන්දිමසුරියේසු පරිවත්තන්තේසු." ඉර හඳ දෙක සම විදිහට පරිවර්තනය වුණහම "සමං නක්ඛත්තානී තාරකරූපානී පරිවත්තන්ති."

නැකැත් තරු පින්වතුනේ සම විදිහට පරිවර්තනය වෙනවා. විෂම වෙලා තිබුණෙ සම වෙනවා.

"සමං නක්ඛත්තේසු තාරකරූපේසු පරිවත්තන්තේසු" එතකොට නැකැත් තරු සම විදිහට පරිවර්තනය වෙනකොට "සමං රත්තින්දිවා පරිවත්තන්තේසු." රෑ දවල් වෙන එක සම විදිහට පරිවර්තනය වෙනවා. "සමං රත්තින්දිවේසු පරිවත්තන්තේසු." රෑ දවල් වෙන එක සම වුණාට පස්සෙ "සමං මාසද්ධමාසා පරිවත්තන්ති." මාස අර්ධ මාස දින සති කියලා මම එදා කිව්වේ ඒවා සම විදිහට පරිවර්තනය වෙනවා. සම කියන්නෙ යහපත් විදිහට හොඳ විදිහට. එතකොට මාසද්ධ මාස කියන ඒවා සම විදිහට පරිවර්තනය වුණහම "සමං උතුසංවච්ඡරා පරිවත්තන්ති."ඍතු පින්වතුනේ එහෙම නැත්නම් මාස අර්ධ මාස කියන්නෙ. ඊට පස්සෙ

අර හේමන්ත, ගිම්හාන, වස්සාන විදිහට සෘතුව අවුරුද්ද කියන එක සමවිදිහට පරිවර්තනය වෙනවා. එතකොට සෘතුව, සංවත්සරය සම විදිහට පරිවර්තනය වෙන කොට “ සමං වාතා වායන්ති ” වායුගෝලය සම විදිහට පරිවර්තනය වෙනවා. දූෂිත වායුගෝලය පින්වතුනේ පිරිසිදු වෙනවා. එතකොට වායුගෝලය පිරිසිදු වුණහම ඒ වායුගෝලය අර මුලින් කිව්වනෙ නරක විදිහට හමනවා දැඩි හෝ අඩු හුළං විදිහට. ඒවා ඔක්කොම සම වෙනවා. එතකොට වාතය සම විදිහට පරිවර්තනය වුණහම “ දේවතා අපරිකුපිතා භවන්ති ” දෙවියෝ කිපෙන්නේ නැහැ. දෙවියෝ කිපෙන්නේ නැහැ. දෙවියෝ සතුටු වෙනවා. දෙවියෝ සතුටු වුණහම “ දේවතාසු අපරිකුපිතාසු ” දෙවිවරු එසේ කුපිත නොවුණහම “දේවෝ සම්මා ධාරං අනුප්පවෙච්ඡති වර්ෂාව සමව වහිනවා. නිසි වෙලාවට නිසි කලට නිසි තැනට වර්ෂාව සමව වහිනවා. එතකොට වර්ෂාව නිසි කලට නිසි තැනට නිසි වෙලාවට වහින කොට ඒකෙ ප්‍රතිඵලයක් වශයෙන් “ සමපාකිනී සස්සානී භවන්ති ” ශස්‍යයෝ සම විදිහට පැහෙනවා පින්වතුනේ. කුඹුරු සමව පැහෙනවා. විෂ නැහැ. එළවළු සමව පැහෙනවා විෂ නැහැ. පලතුරු සමව පැහෙනවා. විෂ නැහැ. එතකොට ඉතා ගුණදායක රසදායක එළවළු පලතුරු තමයි අනුභව කරන්න තියෙන්නෙ. “ සමපාකිනී භික්ඛවේ සස්සානි මනුස්සා පරිභුඤ්ජන්තා.” මෙන්න මේ ගුණදායක බෝගයන් අනුභව කරන මිනිස්සු “ දීඝායුකා ච හොන්තී ” ආයුෂ දිග අය බවට පත්වෙනවා. “වණ්ණවන්තා ච හොන්තී” පැහැපත් අය බවට පත් වෙනවා. “බලවන්තා ච හොන්ති.” “අප්පාබාධා ච හොන්ති” ශක්ති සම්පන්න පුද්ගලයෝ බවට පත්වෙනවා. “ අප්පාබාධා ච හොන්තී.” ලෙඩ අඩු අය බවට පත් වෙනවා.

ඔන්න පින්වතුනේ ධම්මික සූත්‍රය නැත්නම් ධාර්මික වීම පිළිබඳවයි මතක් කළේ. අධාර්මික වීමෙන් ඔබ්බට ගිහිල්ලා ධාර්මික වීම කියන කාරණාව වැදගත් වන නිසා නේන්නම් අපිට ප්‍රාර්ථනා කරන්ට කිව්වෙ “දේවෝ වස්සතු කාලේන.” වෙලාවට වහින්ට

කියලා. වෙලාවට වැස්සෙ නැති වුණොත් විනාශයක් වෙන්නෙ. ඒක වළක්වා ගන්න "සස්ස සම්පත්ති හෝතුච." වෙලාවට වැස්සෙ නැති වුණොත් ශස්‍යයන් විෂම වෙන හින්දා. ශස්‍යයන් විෂම වුණහම "පීතෝ භවතු ලෝකෝච." රටේ ජනතාවගේ ලෝවැස්සන්ගේ සිත සතුටු නැහැ. ඒ නිසා සිතේ සතුට ඇතිවෙන්න නම් වෙලාවට වහින්න ඕන. වෙලාවට වැහැලා ශස්‍ය සම වෙන්ට ඕන. මේ සියල්ල සිදුවෙන්න නම් "රාජා භවතු ධම්මිකෝ." පාලකයෝ ලොව පාලනය කරන පාලකයෝ "ධම්මිකෝ භවතු" ධාර්මික අය බවට පත්වෙත්වා කියන පැතුම තමයි තියෙන්නෙ. මෙය නිතර කළ යුතුයි. එය කරගැනීම සඳහා උත්සුක විය යුතුයි. පාලකයන්ට ධාර්මික වීම සඳහා නැණ නුවණ පහළ වේවා කියන පැතුමෙන් ධර්මානුශාසනාව නිමා කරමු. පුණ්‍යානුමෝදනාවට අවධානය යොමු කරමු.

..........................................................................................................

..........................................................................................................

ධර්මශ්‍රාවක පින්වන්ත සියලු දෙනාටමත් මේ උදාරතර පුණ්‍ය ක්‍රියාවේ ආනිශංස ගුණබල ශක්තිය එකහා සමානව ලැබීම තුළින් මෙලොව දීර්ඝ ආයුෂ හැමට වේවා. පරලොව සුගතිය හැදේවා. මියගිය අයට අපි හැමෝටම නිවන් සුව විඳින්ට මෙම පින පාරමී ධර්මයක්ම වේවායි සාධු කියා ප්‍රාර්ථනා කර ගනිමු.

ආකාසට්ඨාච භුම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු ලෝක සාසනං
චිරං රක්ඛන්තු දේසනං
චිරං රක්ඛන්තු මං පරන්ති.

**සැමට සම්මා සම්බුදු සරණයි......!**